## කොළඹ දිසා අධිකරණයේදී ය.

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

පැමිණිලිකරු.

| | | |
|---|---|---|
| නඩු අංකය | : 3155/විශේෂ | එදිරිව |
| ස්වභාවය | : විශේෂ | |
| වටිනාකම | : රු.100,000/- | |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, චොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

1991 ක්වූ මැයි මස 31 වන දිනදී ය.

ද සිල්වා සහ පෙරේරා යන නාමය, අභිධානය සහ විලාසය යටතේ නීති වෘත්තියේ නිරත ජේ.ඩබ්ලිව්.ඩී.පෙරේරා සහ ඔහුගේ සාහයක වර්ණන් ගුණරත්න මගින් පෙනී සිටිමින්, ඉහත නම සඳහන් 4 වැනි විත්තිකාර සමාගමේ උත්තරයට පිළිතුරු වශයෙන්, ඉහත නම සඳහන් <u>පැමිණිලිකරුගේ වැඩිදුර උත්තරවාදය</u> පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

1. (අ) මෙහි ඉහත නියමිත වශයෙන්ම පිළිගන්නා වූ සම්ප්‍රකාශයන් පමණක් සහ හැරුණු විට එකී උත්තරයේ අඩංගු වී තිබෙන සියලු සහ එක් එක් සම්ප්‍රකාශයන් පැමිණිලිකරු ප්‍රතික්ෂේප කරයි.

(ආ) පැමිණිලිකරු පැමිණිලි පතේ ඇති නොයෙක් සම්ප්‍රකාශයන් නැවත නැවත ප්‍රකාශ කරන අතර, මෙම නඩුවේ ඉදිරිපත් කර ගොනු කර ඇති පී1 සිට පී61(ඒ) දක්වා ලකුණු කර ඇති ලියකියවිලි මත විශ්වාසය තබයි.

2. (අ) මුලින්ම සහ සටහන් කරවා තැබීමේ අරමුණ සඳහා, මෙම නඩුවේ සිතාසි සහ වාරණ නියෝගය භාරදීමෙන් පසුව එවකට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්ව සිටි ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මහතා පැමිණිලිකරුගේ එක් කණිෂ්ඨ නීතිඥ මහතෙකු සමග පැවැත්වූ සාකච්ඡාවන් හි ප්‍රතිඵලයක් වශයෙන්, පැමිණිලිකරු එකී නීතිඥ මහතා සමග එක්ව ගොස් නීතිපති දෙපාර්තමේන්තුවේ එකී ෂිබ්ලි අසීස් මහතා සමඟ පැමිණිලි පතේ ඇති නොයෙක් සම්ප්‍රකාශවල ඇති කරුණු සහ ඒ සමඟ ගොනු කර ඇති ලියකියවිලි සම්බන්ධයෙන් කීපවරක් සාකච්ඡා පවත්වා ඇති බව ද, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටි.

(ආ) මෙම නඩුව 4 වැනි විත්තිකාර සමාගමේ යහපත උදෙසා පවරනු ලැබ ඇති හෙයින්, අන්‍යොන්‍ය සහයෝගය විමසා බැලීම පිළිබඳ පූර්වාවයවය මත මෙම නඩුවට අදාළ වන කරුණු සම්බන්ධයෙන් පහදාදීම් සහ පැහැදිලි කිරීම් අවශ්‍ය වන බවට පැමිණිලිකරුට දෙන ලද අවබෝධය මත මෙම සාකච්ඡාවන් පවත්වන ලදී.

3. එකී උත්තරයේ 2 වැනි ඡේදයට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

(අ) නීතිපති දෙපාර්තමේන්තුවේ පැවති එකී සාකච්ඡාවලදී, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි බහුතර නියෝජනය රජයට ලබාගැනීම පිණිස 4 වැනි විත්තිකාර සමාගමේ සමාගම් ව්‍යවස්ථාවලියට රජයේ නියෝජිත සංශෝධනයන් පිළිබඳව පැමිණිලිකරු වෙත දැනුම් දෙන ලද අතර, ඒ සඳහා පැමිණිලිකරුගේ සහයෝගය ඉල්ලා සිටින ලදී.

(ආ) මෙම නඩුව නිගමනය කරනතුරු අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් ඔහුගේ තත්ත්වයට කිසිදු උපද්‍රවයක් නොකළ යුතු බවත්, 4 වැනි විත්තිකරුගේ යහපත උදෙසාම මෙම නඩුව පවරා ඇති බවත් පැමිණිලිකරු නැවත නැවතත් ප්‍රකාශ කරමින්, අන්‍යොන්‍ය සහයෝගිතාවයේ පූර්වාවයවය මත එකී සාකච්ඡා සම්බන්ධව බැලීමේ දී හුදෙක්ම 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ යහපත උදෙසාම එසේ කිරීමට පැමිණිලිකරු එකඟ විය.

(ඇ) කෙසේ වෙතත්, 1990.12.18 වැනි දින එකී සංශෝධන ඉදිරිපත් කිරීමත් සමඟ සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් දේ හැර, පහත සඳහන් පරිදි, එනම්,

> ''ඉහත සඳහන් කරුණුවලට පටහැනිවීමට සහ/හෝ ඉහත 17 සහ 18 සනාථ කිරීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු අදහස් කරන්නේ නම්, මෙම ලිපියට ලිඛිතව ප්‍රතිචාර දැක්වීමට ඔහුට ආරාධනය කරන අතර, මෙම තදබල කරුණු සම්බන්ධයෙන් කිසියම් අධ්‍යක්ෂකවරයෙකුගේ ස්ථාවරය දැන ගැනිමට හැකිවන අතර, ඉන්පසු එවැනි අධ්‍යක්ෂවරයෙකුට එසේ උපදෙස් ලැබුණහොත්, සමාගමේ යහපත සහ එහි කොටස්කරුවන්ගේ යහපත සඳහා පවරා ඇති නඩුවක් වන අංක.3155/විශේෂ දරණ දිස්ත්‍රික් උසාවි නඩුවේ දී ඔහුගේ ස්ථාවරය ප්‍රකාශ කළ හැකිය.''

යනුවෙන් ද, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂකවරුන් වන මෙම නඩුවේ 5, 6, 7, 8, 9, 10 සහ 11 වැනි විත්තිකරුවන්ගෙන් ඉල්ලා සිටිමින් සමහර සිද්ධීන් පිළිබඳ

ප්‍රකාශයන් දක්වමින්, සැලකිය යුතු ලෙසින්, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ 1990.12.20 දිනැති පැමිණිලිකරුගේ සංදේශයට පසුව 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ තනතුරෙන් පැමිණිලිකරු නතර වී ඇති බව පැමිණිලිකරුට දන්වමින්, කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගම 1990.12.22 දිනැති ලිපියක් පැමිණිලිකරුට භාර දුන්නේ ය.

ඉහත සඳහන් කරන ලද විත්තිකරුවන්ගෙන් කිසිවකු කිසිදු ආකාරයකින් එයට ප්‍රතිචාරයක් දක්වා නැති බව දැන් සටහන් වී ඇති කරුණකි.

(ඇ) මෙම නඩුවේ දී ගරු අධිකරණය විසින් නිකුත් කරන ලද නියෝගවලට පටහැනිව 4 වැනි විත්තිකාර සමාගමේ ගිණුම් සහාගත කිරීම සහ පිළිගැනීම සම්බන්ධව මෙම අධිකරණයේ 3231/විශේෂ දරණ තවත් නඩුවක් පැමිණිලිකරු පවරා ඇති අතර, පැමිණිලිකරු එම නඩුවේ දී අදාළ කරුණු දක්වමින්, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඔහු ඉවත් කිරීම පිළිබඳ අභිප්‍රාය අසද්භාවයෙන් කළ එකක් බවත්, එය නීතියෙන් බලය නැති හෝ ශුන්‍ය බවත් එය 4 වැනි විත්තිකාර සමාගමේ සහ එම කොටස්කරුවන්ගේත් යහපත උදෙසා නොවන බවත් පැමිණිලිකරු එකී නඩුවේ පැමිණිලි පතේ 16 වැනි ඡේදයේ සැළකර සිටියේ ය.

4. එකී උත්තරයට සමස්ථයක් වශයෙන් පිළිතුරු දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි,

(අ) 4 වැනි විත්තිකාර සමාගම එකී උත්තරයේ නොයෙකුත් ඡේදවල පැමිණිලිපතේ සඳහන් කර ඇති නොයෙක් වැදගත් සම්ප්‍රකාශ සම්බන්ධව සිය ''දැනුම් තේරුම් නොමැති බව'' ප්‍රකාශ කරමින් උත්තරවාද කියා ඇති අතර, ඒ මගින් එවැනි සම්ප්‍රකාශයන් සමහර අවස්ථාවලදී අනුමානයෙන් සිතන සහ අනුමාන සහගත කරුණු බව අසත්‍ය ලෙස ස්ථිර කරමින් පවා එවැනි සම්ප්‍රකාශයන්ට පිළිතුරු දීමට මගහැර ඇත. පැමිණිලිකරු කියා සිටින්නේ, මෙම නඩුව හුදෙක්ම 4 වැනි විත්තිකාර සමාගමේ යහපත උදෙසා පවරා ඇති නඩුවක් බවත්, ඉල්ලා ඇති සහන 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ සහ ප්‍රස්තුත ඉතා වැදගත් රාජ්‍ය ඇපකර ලිපි සම්බන්ධව බැලීමේ දී ලංකාවේ මහජනතාවගේ යහපත සඳහා වන සහන වන නිසාත් පැමිණිලි පතට උත්තර දීමේ දී 4 වැනි විත්තිකාර සමාගම ඉතා නිශ්චිත සහ උද්යෝගී විය යුතුව තිබුණ බවත් ය.

(ආ) පැමිණිලි පතේ හෙළිදරව් කර ඇති තදබල සහ වැදගත් කරුණු පෙනෙන හැටියට, හුදෙක්ම 4 වැනි විත්තිකාර සමාගමේ, එහි කොටස්කරුවන්ගේ සහ ඉහත කී පරිදි ශ්‍රී ලංකාවේ මහජනතාවගේ යහපත උදෙසා 4 වැනි විත්තිකාර සමාගම ''දැනුම් තේරුම් නොමැති'' බවට උත්තරවාදය කියා සිටීමට පෙර සිය

සමාගම සෑහීමට පත්වීමට සහ මෙහි ඉහත සඳහන් කළ නොයෙක් සම්ප්‍රකාශයන් පිළිබඳ සත්‍යය සොයා දැනගැනීමට උත්සාහ කිරීමට, අවශ්‍ය විටකදී යම් තාක්ෂණික සහ/හෝ වෘත්තීය සහාය ඇතිව, එකී කරුණු බලවත් ලෙස සෝදිසි කිරීමට සිය විමර්ශන කටයුතු සහ/හෝ විමසීම් කටයුතු 4 වැනි විත්තිකාර සමාගම විසින්ම පවත්වාගෙන යා යුතුව තිබුණි. කරුනු සියල්ලම පසෙක දැමීමට ඇති දැඩි උනන්දුව නිසා, දැනුම් තේරුම් නොමැතිකම පිළිබඳ උත්තර සැළකර සිටිම පැනනැගී ඇති බව පෙනී යයි.

(ඈ) 4 වැනි විත්තාකර සමාගමේ වැඩි කොටස් අයිතිකරු ශ්‍රී ලංකා රජය වන අතර, එකී කොටස් අයිතිකරු මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙයි. අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩි දෙනෙක් මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත් කරන ලද, රජය විසින් නම්කරනු ලැබ, පත්කරනු ලැබ අධ්‍යක්ෂකවරුන් වන අතර, දැනට එම අධ්‍යක්ෂවරුන්ගෙන් හතර දෙනෙක් මුදල් අමාත්‍යාංශයේම ජ්‍යේෂ්ඨ නිළධාරීහු වෙති.

මෙලෙස 4 වැනි විත්තිකාර සමාගමට පැමිණිලි පතේ සඳහන් කර ඇති අදාළ කරුණු සහ තොරතුරු සහ ලබාගැනීමට ප්‍රවේශයන් තිබියදී හා වෙනත් විධිවලින් මෙහි ඉහත සඳහන් කළ යහපත සම්බන්ධව බැලීමේ දී ''දැනුම් තේරුම් නැති බවට'' උත්තරවාද සැළකර සිටීමට පෙර පැමිණිලිපතේ ඇති අදාළ සම්ප්‍රකාශය පිළිබඳ සත්‍ය පහසුවෙන් සොයා දැනගැනීමට පුළුවන්කම තිබුණි.

5. එකී උත්තරයේ 3 වැනි ජේදයට උත්තර දෙමින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානයන් උල්ලංඝනය කරන පරිදි, මෙම නඩුවේ නඩු නිමිත්ත පිළිබඳව මෙම අධිකරණයේ අධිකරණ බලසීමාව පිළිබඳ මෙම නඩුවේ නඩු නිමිත්ත සම්බන්ධ ප්‍රකාශිතවම විරුද්ධව කරුණු ඉදිරිපත් කරමින් 4 වැනි විත්තිකාර සමාගම විසින් පැහැදිලි ලෙස සහ නිශ්චිත ලෙස උත්තරවාද සැළකර නැති බවත්, ඒ හේතුකොටගෙන 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ යහපත උදෙසා පවරන ලද මෙම නඩුවේ නඩු නිමිත්ත පැමිණිලිකරුට පැනනැගී ඇති බව පිළිගෙන ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. පැමිණිලිපතෙහි 59 සහ 60 වැනි ජේදයන්ට 4 වැනි විත්තිකාර සමාගම විසින් විශේෂිත වශයෙන් උත්තරවාද සැළකර නැති බවත්, ඒ හේතුකොටගෙන මෙම නඩුව පවරා පවත්වාගෙන යාමට පැමිණිලිකරුට අයිතිවාසිකමක් ඇතැයි පිළිගෙන ඇති බවත් පැමිණිලිකරුට වාසි වන සේ නඩු නිමිත්තක් පැනනැගී ඇති බව වැඩිදුරටත් පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

6. එකී උත්තරයට සමස්ථයක් වශයෙන් තවදුරටත් උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

(අ) මෙහි ඉහත සඳහන් කළ පරිදි, පැමිණිලිකරුගේ කල්ක්‍රියාවට සහ උත්සාහයන්ට සම්බන්ධ නොපැහැදිලි සහ ඍජු නොවූ උත්තර දීමට වෙනස්ව, විරුද්ධ සාක්ෂිත් තිබියදී වුවත්, 7 වැනි විත්තිකරුගේ සහ 5 වැනි විත්තිකරුගේ හා 4 වැනි විත්තිකාර සමාගමේ විධායක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළ 1 වැනි සහ 2 වැනි සමාගම්වල නියෝජිතයින්ගේත් කල්ක්‍රියාවට සහ හැසිරීමට අදාළව පැමිණිලි පතේ ඇති සමහර සම්ප්‍රකාශයන් සම්බන්ධව නිදහසට කරුණු කීමට, ප්‍රතික්ෂේප කිරීමට සහ පැහැදිලි කිරීමට හා උත්තරදීමට 4 වැනි විත්තිකාර සමාගම සිය උත්තරයේ විශේෂිත උත්සාහයක් දරා ඇත.

(ආ) දී ඇති කරුණු තිබෙන හැටියට, ඉහත කී පුද්ගලයින් ඔවුන්ගේම අධිනීතිඥ මහතුන් සහ නීතිඥ මහතුන් විසින් නියෝජනය කරනු ලබද්දී, ඔවුන්ගේ නිදහස උදෙසා කැමැත්තෙන්ම උත්තර කියා සිටීමට සහ තවද, ඒ පිළිබඳ පෞද්ගලික දැනීම නැතිව ඔවුන්ගේ කල්ක්‍රියාව සහ හැසිරීම පිළිබඳව නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට 4 වැනි විත්තිකාර සමාගමට සිද්ධිමය වශයෙන් හා නීතියෙන් නෛතික අයිතිවාසිකමක් සහ හිමිකමක් නැත. 7 වැනි සහ 5 වැනි විත්තිකරුවන්ගේ අධිනීතිඥ මහතා උත්තර බැඳීමට කලින් දිනයක් ලබාගෙන ඊට පසුව 4 වැනි විත්තිකාර සමාගම උත්තරය ඉදිරිපත් කළ එම එකී දිනයේදී ම ඔවුන් උත්තරය ඉදිරිපත් නොකරන බව අධිකරණයට දන්වමින් මෝසමක් ඉදිරිපත් කළේ ය.

(ඇ) 4 වැනි විත්තිකාර සමාගමේ නිළධාරින් වශයෙන්, ඉහත කී පුද්ගලයන්ගේ හැසිරීම සහ කල්ක්‍රියාව සම්බන්ධයෙන් වන තදබල සහ වැදගත් සම්ප්‍රකාශවලින් පෙනී යන හැටියට, ඉහත කී පුද්ගලයින් වෙනුවෙන් කැමැත්තෙන් උත්තර කියා සිටිමට නෛතික අයිතිවාසිකමක් සහ හිමිකමක් 4 වැනි විත්තිකාර සමාගමට ඇති බව පිළිගනු ලැබුවේ වූ නමුත්, එවැනි උත්තර කැමැත්තෙන් කියා සිටිමට පෙර 4 වැනි විත්තිකාර සමාගම විසින් එකී කරුණු පිළිබඳව, ඒවායේ සත්‍යතාවය හෝ අසත්‍යතාවය දැන ගැනිමට ප්‍රථම අවස්ථාවේදී පරීක්ෂණ පැවැත්විය යුතුව තිබුණි.

(ඈ) මුල සිටම 5 වැනි විත්තිකරු 4 වැනි විත්තිකාර සමාගමේ සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කර ඇති අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල එකී නියෝජිතයින් එහි විධායක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කර ඇත. තවද, පැමිණිල්ලේ සඳහන් කර ඇති සහ එකී උත්තරයේ 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගනු ලැබ ඇති නොයෙක් තදබල කරුණු පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම හා 4 වැනි විත්තිකාර සමාගමේ යහපතට හානිකර වූ, එම කරුණු පිළිබඳ යම් කඩකිරීමක් වෙනුවෙන්වත් එකී පුද්ගලයින් ඒ සම්බන්ධව වගකීමට හා උත්තරදීමට හසුකර ගැනිමට සම්බන්ධ සිය යුතුකම ඉටු කිරීමට 4 වැනි විත්තිකාර සමාගම අපොහොසත්ව පැහැර හැර ඇත.

(ඉ) ඉහත කී පරිදි 4 වැනි විත්තිකාර සමාගමට, ශ්‍රී ලංකා රජය හා මහජනයා ඇතුළු එහි කොටස්කරුවන්ට හානියක් සිදුකර තිබියදීත්, එකී නොයෙක් කරුණු පිළිබඳව නිසි පරීක්ෂණයක් නොපවත්වා ඉහත කී පුද්ගලයින්ගේ අයුතු ක්‍රියාවන් සඟවා තැබීමට 4 වැනි විත්තිකාර සමාගම උත්සුක වන බව පැහැදිලි ය.

(ඊ) තමා සඳහා කිසිදු සහනයන් අයැද නොසිට 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ සහ ශ්‍රී ලංකා මහජනයාගේ යහපත සඳහාම ක්‍රියාකරමින් පැමිණිලිකරු විසින් සැළකිය යුතු උත්සාහයන් වෘත්තීමය කාලයක් වැය කර සහ වියදම් කර තිබියදීත්, ඊට විරුද්ධ වශයෙන් වූ 4 වැනි විත්තාකර සමාගමේ එකී උත්තරයේ පැහැදිලි පක්ෂවාදී භාවයක් විදහා දක්වන අතර, ඉහතින් කී පරිදි එය 4 වැනි විත්තිකාර සමාගමට එහි කොටස්කරුවන්ට සහ ශ්‍රී ලංකා මහජනයාට තවදුරටත් හානිකර වේ.

(උ) 1990.10.16 දින 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ පරිදි, 4 වැනි විත්තිකාර සමාගමේ නිදහසට කරුණු ඉදිරිපත් කිරිම සඳහා වන විශේෂිත අරමුණ සඳහා ගරු නීතිපතිතුමාට පෙරකලාසිය දුන්නා මිස ශ්‍රී ලංකා රජයෙන් නම්කර පත් කළ නියෝජිතයින් නොවන ඉහත කී පුද්ගලයින්ගේ නිදහසට කරුණු ඉදිරිපත් කිරිමට පෙරකලාසිය නුදුණි. තවද, ඊට වෙනස් වශයෙන් රජය නම් කර පත් කළ අධ්‍යක්ෂවරුන් වෙනුවෙන් පෙනි සිටින ගරු නීතිපතිතුමා පුදුමයකට මෙන්, ඔවුන් වෙනුවෙන් උත්තර බැඳ හෝ වැදගත් වන සහ හුදෙක්ම, 4 වැනි විත්තිකාර සමාගමේ යහපත උදෙසාම තිබෙන පැමිණිලි පතේ සඳහන් කර ඇති, එවැනි පුද්ගලයින්ගේ ක්‍රියාකලාපයට හා හැසිරීමට අදාළ වන සම්ප්‍රකාශයන් සම්බන්ධව පහදා දී, පැහැදිලි කර හෝ කැමැත්තෙන් උත්තර කියා හෝ නැත.

7. එකී උත්තරයේ 4, 5, 6 සහ 8 වැනි ජේදයන්ට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි,

(අ) ''ඇතුළට නෙරා තිබූ කාමර ගර්භ 452'' සහ ''ඇතුළට නෙරා තිබූ ගර්භය ඇති අමුත්තන්ගේ කාමර 452'' සම්බන්ධව සඳහන් කිරිමේ දී මෙම නඩුවට ගොනු කර ඇති 3 වැනි විත්තිකාර සමාගමේ ගෘහ නිර්මාණ ශිල්පි සහ විධායක අධ්‍යක්ෂ කෙන්ෂෝ වටනාබේ ගේ 1990.11.20 දිනැති දිවුරුම් ප්‍රකාශයේ සහ ඊට අනුරූප වන 3 වැනි විත්තිකාර සමාගමේ විරුද්ධතා ප්‍රකාශයෙහි පහත සඳහන් පරිදි කර ඇති, තමන්ගේම ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ එනම් 3 වැනි විත්තිකාර සමාගමේ ''ඇතුළට නෙරා ගිය ගර්භය'' පිළිබඳව අර්ථ නිරූපනය කිරිම සැලකිල්ලට ගැනිමට 4 වැනි විත්තිකාර සමාගම අපොහොසත් වී ඇත.

''බේ'' (   ) (හෝ සමහරවිට ඒකකයක් වශයෙන් හඳුන්වනු ලබන) යනු සම්මත ප්‍රමාණයේ කාමර ඉදිකිරීමේ ඒකක ප්‍රමාණයක් ය. එනම්, ''බේ'' (   ) යන සම්මත ප්‍රමාණයේ ''කාමර'' ඒකක ප්‍රමාණයක් වේ.''

ස්වාධීන වරලත් ගෘහ නිර්මාණ ශිල්පී ෂෙල්ටන් විජයරත්න මහතා ඔහුගේ වාර්තාවේ (පී32අ) 4 වැනි පිටුවේ විෂය අංක.(vi) හි පහත සඳහන් පරිදි වැඩිදුරටත් තහවුරු කර සහතික කරයි.

''ඇතුළට නෙරාගිය එක් කාමර ගර්භයක් නියම පිළිගැනීම අනුව එක් සාමාන්‍ය ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමරයක් වේ''

එමනිසා ''නෙරාගිය කාමර ගර්භ 452'' යනු ඇත්තවශයෙන්ම ''සාමාන්‍ය ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර 452 ක්'' බව නිර්මලව පැහැදිලිව පෙනී යයි.

(ආ) 4 වැනි විත්තිකාර සමාගම එකී හෝටල දේපළෙහි අයිතිකරුම වන අතර, පහත දක්වා ඇති පරිදි,

i. කොටස් මහජන නිකුතුව සඳහා පළ කළ සිය සමාගමේ ප්‍රකාශ පත්‍රයේ ම එකී හෝටලය කාමර 452 කින් සමන්විත විය යුතුය යනුවෙන් නියම කර ඇති බව 4 වැනි විත්තිකාර සමාගම එකී උත්තරයේ 7 වැනි ඡේදයේ පිළිගනී.

ii. 1984.01.07 දින පැවැති විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, හෝටල් ව්‍යාපෘතිය සහ එකී උත්තරයේ 4, 5, 6 සහ 8 වැනි එකී ඡේදවල සඳහන් කර ඇති ගිවිසුම්/කොන්ත්‍රාත් සහ 3 වැනි විත්තිකාර සමාගමේ ගෘහ නිර්මාණ සැළසුම් අනුමත කිරීමේ දී හෝටලයට <u>අමුත්තන්ගේ කාමර 452</u> තිබිය යුතු බවට සහ තවද, 1 වැනි විත්තිකාර සමාගමේ ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණය <u>අමුත්තන්ගේ</u> කාමර 452 මත පදනම් වූ බව අධ්‍යක්ෂ මණ්ඩලය සැළකිල්ලට ගෙන ඇත.

iii. 4 වැනි විත්තිකාර සමාගම එකී උත්තරයේ 4, 5, 6 සහ 18 වැනි ඡේදවල, පැමිණිලි පතෙහි තිබෙන 9, 10 සහ 31(ඇ) ඡේදවල ඇති සම්ප්‍රකාශයන් පිළිගනිමින් හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් <u>1983.03.31</u> දිනැති ඔවුන්ගේ ලිපියෙන් ස්ථිර කරන ලද පරිදි එම හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ ආදායම සහ වියදම පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශය (පී27ඒ) සහ (පී27බී) 3 වැනි විත්තිකාර සමාගම් 1980 සැළසුම් (පී8) සමඟ

අනුකූල වූ බව සහ එය අමුත්තන්ගේ කාමර 452 ක කළමණාකරුගේ වාසස්ථානය සඳහා වෙන්කළ කාමර 4 වශයෙන් කාමර 456 ක් සඳහා වූ බව සහ තවද, ඉදිකිරීමේ මිළ නිශ්චිතව හා වෙනත් අදාළ නියම කිරීම් හා වෙනත් මිළ ගණන් දක්වමින් එම එකී දිනම මූලික ගිවිසුම අත්සන් කිරීම මත ඉදිකිරීම සඳහා වන ප්‍රදාන ලිපිය 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට නිකුත් කළබව පිළිගනී.

යනුවෙන් ද වෙනත් ජේදයන් හි සිය එම එකී උත්තරයේ පැහැදිලිව පිළිගෙන, එකී හෝටලය සමන්විත විය යුතු අමුත්තන්ගේ කාමර ගණන කොපමණ ද යන්න ගැන 4 වැනි විත්තිකාර සමාගම සිය මනසේ නිර්මල ලෙස පැහැදිලිව සිටිය යුතුය.

8. එකී උත්තරයේ 8 වැනි ජේදයට උත්තර දෙමින් පැමිණිලිකරු තවදුරටත් මෙසේ ප්‍රකාශ කරයි. 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගත් පරිදි, ඉදිකිරීමේ ගිවිසුම මඟින් තට්ටු 22 ක් නියම කරන ලද බවත්, එකී උත්තරයේ 7 වැනි ජේදයේ 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගන්නා ලද පරිදි ප්‍රකාශ පත්‍රයේ ඉහළට විහිදී යන මහල් 22 ක් නියම කර ඇති බවත්, එමනිසා අනෙකුත් ගිවිසුම්/කොන්ත්‍රාත්තු එයට ආනුෂංගික වන හෙයින්, ඒවා මඟින් වෙනත් අයුරකින් අදහස් කර තිබිය නොහැක.

9. එකී උත්තරයේ 10 වැනි ජේදයට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි. 1985.07.25 වැනි දින, අධ්‍යක්ෂ මණ්ඩලට 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වල වාර්තා (පී21බී) ලබාදෙන ලෙස ඉල්ලමින් 1985.07.22 දිනැති සිය ලිපියෙන් (පී21ඒ) පැමිණිලිකරු විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමක් <u>තිබියදීත්</u> 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළිදරව් නොකරමින්, <u>1985.08.08</u> වැනි දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත, අලුතින් සකස් කරන ලද <u>1985.07.15</u> දිනැති සංශෝධිත සැළසුම් රහසින් ඉදිරිපත් කර තිබීමේ කරුණ මඟින්ම, ඉල්ලුම් කරන ලද වාර්තා ඉදිරිපත් නොකරන ලද බවට වන පැමිණිලිකරුගේ සම්ප්‍රකාශය නිදොස් බව ඔප්පු කරයි. 4 වැනි විත්තිකාර සමාගම මේ ගැන දැන සිටින අතර, එය එසේ නොවේ යැයි කියා ඔප්පු කිරීමට අපොහොසත් වී ඇත.

10. එකී උත්තරයේ 11 වැනි ජේදයට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි. මීට ඉහතින් වූ ජේදයෙහි සඳහන් කරන ලද සැළසුම් <u>සංශෝධිත සැළසුම්</u> (පී54) වශයෙන් 3 වැනි විත්තිකාර සමාගමේ මුල් සැළසුම් සඳහා වන සංශෝධනය කිරීම්/වෙනස්කිරීම් දක්වන (පී32බී) උපලේඛණය සම්බන්ධව බැලීමේ දී, මීට ඉහතින් වූ ජේදයේ සඳහන් කරන ලද සැළසුම් <u>සංශෝධිත සැළසුම් (පී54)</u> වශයෙන් 1986 අප්‍රේල් මස නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කිරීමේ හේතුවෙන්ම, <u>1990 මාර්තු මාසයේ දී සොයා ගන්නා ලද එම සංශෝධිත සැළසුම් මුල් සැළසුම් වලින් සංශෝධනය කර/වෙනස්</u>

කර කරගත් ඒවා බවට පිළිගෙන ඇති බවත් සහ එමනිසා පැහැදිලිව පෙනී යන පරිදි ඒවා මුල් සැලැස්මවල්ම විය නොහැක.

11. එකී උත්තරයේ 13 වෙනි ඡේදයට පිළිතුරු දෙමින්, 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගනු ලැබ ඇති පරිදි ආදායම් ප්‍රක්ෂේපන ගණන් හදනු ලැබ ඇත්තේ කුමන අමුත්තන්ගේ කාමර ගණන මත ද යන්න (හෝටලය ව්‍යාපාර සඳහා විවෘත කළ පසුව) 1987 ජුලි මාසයේ දී 1 වැනි විත්තිකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද ලාභ උපදවන පූර්වානුමාන ප්‍රකාශ වලින්ම සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපන වලින්ම සාක්ෂි දරණ බව සහ පැහැදිලිවන බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් පසුව ප්‍රකාශ කරනු ලැබ ඇති පරිදි කාමර සංඛ්‍යාවේ වෙනස 387 වශයෙන් ඇති බවටත් මුලින් එකඟවනු ලැබ ඇති පරිදි 452 ක් නොවූ බවටත් 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 1987.12.30 දින පැමිණිලිකරු විශේෂිතව දැනුම් දී ඇති බවට පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති පැමිණිලිපතේ 27 වැනි ඡේදයේ තිබෙන සම්ප්‍රකාශයන් තම සමාගමේම පිළිගැනීම අනුව තවදුරටත් සාක්ෂි දරණ පරිදි හා පැමිණිලිකරු විසින් කලින් මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කාමර 387 ක් වෙනුවෙන් 1 වැනි විත්තිකාර සමාගමේ ඇම්.කුබෝටා විසින් ඉදිරිපත් කරන ලද ජපානයේ සිට ෆැක්ස් මඟින් එවනු ලැබූ 1987.12.21 සහ 1987.12.09 දිනැති ප්‍රතිශෝධිත ලාභ උපදවන සහ මුදල් ගලන ප්‍රක්ෂේපනයන් (පිළිවෙලින් පී25සී සහ පී25සී අන්තිම කොළය) තවදුරටත් සාක්ෂි දරණ පරිදි පැමිණිලිපතේ 26(ඇ), 26(ඈ) සහ 26(ඉ) ඡේද පිළිබඳව 4 වැනි විත්තිකාර සමාගම දැනුම් තේරුම් නොමැති බව ප්‍රකාශ කිරීම අසත්‍ය වේ.

12. එකී උත්තරයේ 18, 19 සහ 49 වැනි ඡේදයන්ට උත්තර දෙමින් පැමිණිලිකරු මෙසේ ප්‍රකාශ කරයි.

(අ) පැමිණිලි පතෙහි 31(අ), 31(ආ), 31(ඇ) සහ 31(ඈ) උප ඡේදයන් හි සම්ප්‍රකාශයන් පිළිබඳව 4 වැනි විත්තිකාර සමාගම නොදැන සිටි බව උත්තරයේ 18 ඡේදයෙන් කියා සිටීම චමත්කාරජනක වන්නේ, එකී උත්තරයේ 19 වැනි ඡේදයෙහි 4 වැනි විත්තිකාර සමාගම විසින් මෙම ස්ථාවරයට පටහැනිව යමින්, ස්වාධීන වරලත් ගෘහ නිර්මාණ ශිල්පී ෂෙල්ටන් විජයරත්න මහතාගෙන් එකී වාර්තාව පිළිබඳව දැන සිටීම ගැන උත්තරවාද සැළකර සිටින හෙයිනි.

(ආ) එකී උත්තරයේ 4 වැනි ඡේදයේ මූලික ගිවිසුම (පී6) 1983.03.30 දින අත්සන් කරන ලද බව 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගෙන ඇති අතර, ඉදිකිරීම් ගාස්තුව නිශ්චිත වශයෙන් දක්වමින් හා එකඟ වෙමින්, 1983.03.30 වැනි දින 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් වෙත ඉදිකිරීම ප්‍රදාන කිරීමේ ලිපිය නිකුත් කිරීම ද පිළිගනී. එමෙන්ම හිල්ටන් ආයතනයේ 1983.03.31 වැනි දින දරණ ලිපියෙන් තහවුරු කර ඇති පරිදි හිල්ටන් ආයතනයේ ආදායම් සහ වියදම් පිළිබඳ

පූර්වානුමාන ප්‍රකාශය පී7(අ) සහ පී7(ආ) කාමර 452 ක් සඳහා බවත් එහි පදනම මත 1980 ජූලි මස, 3 වැනි විත්තිකාර සමාගම විසින් ගෘහ නිර්මාණ සැළසුම් ඉදිරිපත් කරන ලද බවත් උත්තර පතෙහි 9 වනි ජේදයෙහි තවදුරටත් 4 වනි විත්තිකාර සමාගම පිළිගනි.

(ඇ) එකී උත්තරයෙහි 37 වැනි ජේදයේ සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් (පී54) සම්බන්ධව 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගෙන ඇත.

(ඈ) මීට ඉහතින් වූ උප ජේදයන් හි සඳහන් කරන ලද සියලුම ලියකියවිලි 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගැනිමෙන් පසුව එකී උත්තරයේ 19 වැනි ජේදයේ සඳහන් කර ඇති පරිදි ස්වාධීන වරලත් ගෘහ නිර්මාණ ශිල්පීගේ වාර්තාව ගැන හෝ එමඟින් එළඹෙන නිගමනවල  වලංගුභාවය අදහස් දැක්වීම නොහැකි බවට සඳහන් කර සිටීම වගකීමෙන් තොර වූවක් වන අතර, මෙයට විරුද්ධ වශයෙන් 4 වැනි විත්තිකාර සමාගම විසින් තමාගේ යහපත සඳහා සහ එහි කොටස්කරුවන්ගේ සහ ඇපකරු වශයෙන් රජයේ යහපත සහ මහජනයාගේ යහපත සඳහා පැමිණිල්ලේ සඳහන් සම්ප්‍රකාශ කීපයක් ගැන තමන් සෑහීමට පත්වීම සඳහා ඉහත කී ලියකියවිලි පරික්ෂා කර බලවත් ලෙස සෝදිසි කළයුතුව තිබුණි.

13. එකී උත්තරයේ 22 වැනි ජේදයට පිළිතුරු දෙමින් පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි,

(අ) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ලැබුණු 1989.08.20 දින ලිපිය 1989 නොවැම්බර් මස 06 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී (පී34බී) පැමිණිලිකරු සහ රජයෙන් පත් කළ අධ්‍යක්ෂ ආචාර්ය ඒ.සී.රන්දෙනි විසින් නඟන ලද විරෝධතාවල ප්‍රතිඵලයක් වශයෙන් බව එකී ලිපියෙන් (පී34සී) සාක්ෂි දරයි. 1989 ජූලි මාසයේ දී එම ගිවිසුම්වලට පැහැදිලිවම මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඔහුගේ අත්සන තබන විට, ඔහුට නිවැරදි ලෙස උපදෙස් දී නොතිබුණා විය හැකිය.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ථයක් වශයෙන් උකස දීමට විරුද්ධ වූයේ ය යන එකී උත්තරයේ 22 වැනි ජේදයේ කර ඇති සිය සමාගමේ ම පිළිගැනිම සම්බන්ධව බැලීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලයේ දී එවැනි පිළිගත් ඒකමතිකභාවය උල්ලංඝනය කරමින්, එවැනි උකස් වගන්තියන් ඇතුළුව 1989 ජූලි මාසයේ දී එකී ගිවිසුම 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත එච්.ඔගාම් සමඟ 5 වැනි විත්තිකරු එකතු වී ක්‍රියා කරමින් එකී ගිවිසුම අත්සන් කර ඇත්තේ කෙසේ ද යන්න පැහැදිලි කිරිමට 4 වැනි විත්තිකාර සමාගම අපොහොසත් වී ඇත. හෝටලය උකස් කිරිමට සිදුකළ එම බැඳීම රහසින් කූට ලෙස කළ අතර, ඒ අනුව

අධ්‍යක්ෂ මණ්ඩලයට එය නිවැරදි කිරීමට බලකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සිදුවූ බව පැමිණිලිකරු නැවත නැවතත් ප්‍රකාශ කරයි.

14. එකී උත්තරයේ 24, 26 සහ 27 යන ජේදවලට පිළිතුරු දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

(අ) 4 වැනි විත්තිකාර සමාගමේ විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත එච්.ඔගාමි සමඟ 1989 නොවැම්බර්/දෙසැම්බර් මාසවල එකී ලිපි (පී36අ), (පී36ආ), (පී36ඇ) සහ (පී36ඈ) ගනුදෙනු කළේය, යන්න පැමිණිලිපතේ 37 වැනි ජේදයේ තිබෙන සම්ප්‍රකාශයන් පැමිණිලිකරු නැවත නැවතත් ප්‍රකාශ කරන අතරම, එම ලිපිවල පිටපත් 4 වැනි විත්තිකාර සමාගමේ තිබෙන්නට පුළුවන් අතර, එමනිසා ප්‍රකාශ කරන්නේ ඒ පිළිබඳව දැනුම් තේරුම්කම නැති බවට උත්තරවාද සැළකර සිටීමට විත්තිකාර සමාගමට නොහැකි බවය.

(ආ) පැමිණිලිපතේ 36 වැනි ජේදයේ ප්‍රකාශ කර ඇති පරිදි පැමිණිලිකරුගේ සිතෙහි බරපතල සැකයක් හටගත් හෙයින්, එකී ලිපි හුවමාරුව සිදුවිය. එය හුදෙක්ම 4 වැනි විත්තිකාර සමාගමේ යහපත උදෙසාම විය. ඒ පිළිබඳ සත්‍ය සොයා ගැනීමට උත්සාහයක් නොකර, දැනුම් තේරුම් නොමැතිකම පිළිබඳ 4 වැනි විත්තිකාර සමාගමේ උත්තරයේ ප්‍රකාශය වගකීමෙන් තොර එකක් වෙයි.

(ඇ) එකී ලිපි හුවමාරුවේ වැදගත්කම නම් හස්ථසාර ප්‍රශ්න නැගුවිට මුල් ගෘහ නිර්මාණ සැළසුම් ඇත්ත වශයෙන්ම සංශෝධනය කරනු ලැබ ඇති බව ඒ අවස්ථාවේදීවත් එකී එච්.ඔගාමි හෙළිකර නොතිබීම වෙයි. තවද, එම වැදගත් සිද්ධිය 3 වැනි විත්තිකාර සමාගමේ වැඩ අවසන් සහතිකයේ සහ අවසාන සහතිකයේවත් හෙළිදරව් නොකළේ ය.

(ඈ) එකී ලිපි පිළිබඳව 4 වැනි විත්තිකාර සමාගමේ දැනුම් තේරුම් නොමැති බවට කළ ප්‍රකාශයට පටහැනිව කෙසේ වෙතත්, එකී උත්තරයේ 46 සහ 47 වැනි ජේදවල පැමිණිලිකරු විසින් එච්.ඔගාමි සමඟ 1990 අප්‍රේල් මාසයේ දී කරන ලද සමාන ලිපි ගනුදෙනු (පී44ඒ), (පී44බී), (පී44සී) සහ (පී44ඩී) 4 වැනි විත්තිකාර සමාගම පිළිගනී.

15. එකී උත්තරයේ 25 වැනි ජේදයට උත්තර දෙමින්, පැමිණිල්ලේ 38(අ) ජේදයෙහි සම්ප්‍රකාශ නැවත නැවතත් සඳහන් කරමින්, 14(අ), 14(ආ) සහ 14(ඇ) වැනි මීට ඉහතින් දැක්වෙන ජේදයන් හි සඳහන් කර ඇති ලිපි ගනුදෙනුවලින්, අදාළ ලියකියවිලි ඉල්ලා තිබීමේ පැමිණිලිකරුගේ ස්ථාවරය නිදොස් බව ඔප්පු කර ඇති බවත්, එවැනි ලියකියවිලි

නොමැතිවීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යවන ලද 1989.12.13 දිනැති සංදේශයෙන් වෙනත් දේ අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට ගෙවීම් කිරීම ගැන විරුද්ධත්වය පැහැදිලි ලෙසින් දක්වා ඇති බව ප්‍රකාශ කරයි.

16. එකී උත්තරයේ 29 සහ 30 ඡේදයන්ට උත්තර දෙමින්, 1990.01.26 වැනි දින මුදල් අමාත්‍යාංශයේ රැස්වීම පැවැත්වීමට පෙර 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව දැනුමක්, අනුමැතියක් හෝ කැමැත්තක් නොතිබීමත් ඒ අනුව එම රැස්වීමට සහභාගීවීමට 7 වැනි විත්තිකරු සහ 5 වැනි විත්තිකරුටත් අවසරයක් නොමැති බවත් නැවත නැවතත් සඳහන් කරයි. එකී රැස්වීම 1990.02.28 වැනි දින දී පමණක් එනම්, 1990.01.26 දින පැවැත්වූ එකී රැස්වීමට පසුව, අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දුන් බව 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගෙන ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. එවැනි රැස්වීමක් සම්බන්ධව විශේෂයෙන් 7 වැනි සහ 5 වැනි විත්තිකරුවන් එවැනි රැස්වීමකට සහභාගිවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව දැනුමක්, කැමැත්තක් අනුමැතියක් තිබීමේ සිද්ධිය 4 වැනි විත්තිකාර සමාගම විසින් තරයේ ඔප්පු කරන ලෙස පැමිණිලිකරු ඉල්ලා සිටී.

17. එකී උත්තරයේ 31 වැනි සහ 32 වැනි ඡේදයන්ට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

(අ) ප්‍රශ්නයට භාජනය වී ඇති කරුණු වලට අදාළව පූර්ණ යෝජනාවක් හා අදාළ ලිපි ලේඛණ නොමැතිවීම නිසා 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට කිසිදු ගෙවීමක් කිරීමට විරුද්ධත්වය දක්වන ලද පැමිණිලිකරුගේ 1989.11.27 පී38(ආ) සහ 1989.12.13 දින දරණ සංදේශ පිළිබඳව එකී උත්තරයේ 28 වැනි ඡේදයෙන් 4 වැනි විත්තිකාර සමාගම පිළිගෙන ඇත.

(ආ) පැමිණිලි පතෙහි 40(ඈ), 40(ඉ) සහ 40(ඊ) උප ඡේදයන් හි දැක්වෙන වැදගත් සම්ප්‍රකාශ 4 වැනි විත්තිකාර සමාගම ප්‍රතික්ෂේප නොකරයි.

(ඇ) ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් අත්තිකාරම් වශයෙන් දෙන ලද මුදල් එකී ඇපකර ලිපි යටතේ ලැබිය යුතු මුදල වශයෙන් වන යම් මුදලක් වෙනුවෙන් යෙදීමට පමණක් ඉල්ලුම් කළ හැකිය.

(ඈ) එවැනි රැස්වීම්වල දී 4 වැනි විත්තිකාර සමාගම නියෝජනය කිරීමට 7 වැනි විත්තිකරුට සහ 5 වැනි විත්තිකරුට අවසර දී නොමැතිවීම විශේෂ වශයෙන් හේතුකොටගෙන පැමිණිලි පතෙහි 40(උ) දරණ උප ඡේදයෙහි සම්ප්‍රකාශ ප්‍රතික්ෂේප කිරීමට සිද්ධිමය සහ නීතිමය වශයෙන් 4 වැනි විත්තිකාර සමාගමට හිමිකමක් නැති අතර, ඊට පසුව 1990.02.08 වැනි දින පැවති 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒ බවට කිසිදු වාර්තාවක් ලැබී නැත.

විරුද්ධ වශයෙන් ගත් කළ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ (පී39(අ)) 3 වැනි විෂය අංකය වශයෙන් සටහන් කර ඇති, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වූ 5 වැනි විත්තිකරුගේ වාර්තාව බොහෝ සෙයින් විශේෂිතව කරුණු හෙළිදරව් කරයි.

18. එකී උත්තරයේ 26, 27, 33, 34, 35, 36 සහ 37 වැනි ජේදවලට පිළිතුරු දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

(අ) පැමිණිලිපතේ 38(අ) සහ 38(ඇ) සම්බන්ධව, වෙනත් ලියකියවිලි අතර, විශේෂයෙන් නියම කළ පරිමාණ පත්‍ර සහ අවසාන වැඩ මැනීම් වැනි සනාථ කරන ලියකියවිලි අවසාන සහතිකය තිබිය යුතුය යන්න ඇතුළුව ''ඉදිකිරීම් කර්මාන්තයේ ව්‍යවහාරයන් සම්බන්ධ සමාගම දැනුම් තේරුම් නැතිව සිටින බව එකී හෝටල් දේපලේ අයිතිකාර වන 4 වැනි විත්තිකාර සමාගම එකී උත්තරයේ 26 සහ 27 වැනි ජේදවල උත්තරවාද කියා සිටීම වගකීමෙන් තොර, වංක, අසත්‍ය සහ එය 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ සහ තවද, 4 වැනි විත්තිකාර සමාගම විසින් ම සාකච්ඡා කොට පිළියෙළ කරනු ලැබ ඇති හා දැනට ඉල්ලා සිටින පරිදි ඇමෙරිකානු ඩොලර් මිලියන 150.0 (රුපියල් මිලියන 6000.00) වැනි ගණනක් වන රාජ්‍ය ඇපකර ලිපි සම්බන්ධව බැලීමේ දී ශ්‍රී ලංකාවේ මහජනතාවගේ යහපත ද උදෙසා නොවෙයි.

(ආ) පැමිණිලිකරු විසින් ඒ අවස්ථාවේ දී මතු කරන ලද කාමර ගණන ගැන වූ වෙනස පිළිබඳ පසුබිම යටතේ (වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික වරලත් ගණකාධිකාරී, අර්නස්ට් ඇන්ඩ් යං ව්‍යාපාරයේ ප්‍රධාන හවුල්කාර) එවකට රජයේ, පත්කළ අධ්‍යක්ෂ ඇම්.ටී.ඇල්.ප්‍රනාන්දු විසින් ස්වාධීන ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබාගත යුතුව තිබුණි, යනුවෙන් යෝජනා කළ විට, 4 වැනි විත්තිකාර සමාගම විසින් එසේ කළ යුතුව තිබුණු හේතුවම මෙය වෙයි. කෙසේ වෙතත්, කෙසේ හෝ 7 වැනි විත්තිකරු විසින් දෙන ලද 1988.08.26 දිනැති ඔහුගේ ලිපියෙන් සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත එච්.ඔගාමි විසින් වළක්වන ලද අතරම, 5 වැනි විත්තිකරු එකී ලිපියට 7 වැනි විත්තිකරුට ස්තුති කළේ ය.

(ඇ) එකී උත්තරයේ 26 වැනි ජේදයේ ඇති 4 වැනි විත්තිකාර සමාගමේ සම්ප්‍රකාශයන්ට සම්පූර්ණයෙන් පටහැනිව, 3 වැනි විත්තිකාර සමාගමෙන් ඒකාන්ත නියමයන් අනුව පැහැදිලි කිරීම් ඉල්ලමින් ඉදිරිපත් කළ 1987.12.13 දිනැති පැමිණිලිකරුගේ සංදේශය, මණ්ඩල තීරණයක් නැතිව, එකී එච්.ඔගාමි 7 වැනි විත්තිකරු වෙත යොමු කර ඇති බව තවදුරටත් සටහන් කළයුතු විශේෂිත කරුණක් වෙයි.

(ඈ) 4 වැනි විත්තිකාර සමාගම සහ 3 වැනි විත්තිකාර සමාගම අතර ඇතිකර ගත් සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුමේ (පී14) විශේෂයෙන් එකී ගිවිසුමේ 6.01, 6.04, 6.05 සහ 6.12 වගන්තිවල නියම කර ඇති 3 වැනි විත්තිකාර සමාගමේ නොයෙක් කොන්ත්‍රාත් බැඳීම් නොදත් බවට, දැනුම් තේරුම් නැති බවට උත්තරවාද කිය සිටීමෙන් සහ ප්‍රතික්ෂේප කිරිමෙන් 4 වැනි විත්තිකාර සමාගම ප්‍රතිබන්ධනය වෙයි.

(ඉ) එකී එච්.ඔගාමිගේ ඇවටිල්ල මත 7 වැනි විත්තිකරු 1990.02.28 දිනැති ඔහුගේ ලිපිය ඉදිරිපත් කිරිමේ දී සියලු අදාළ ලියකියවිලි 7 වැනි විත්තිකරු සළකා බලන්නට ඇත යන එකී උත්තරයේ 26 සහ 36 ජේදවල ඇති 4 වැනි විත්තිකාර සමාගමේ සම්ප්‍රකාශය, ඉහත සඳහන් කළ එකී චිත්‍ර සහ සැළසුම් ගිවිසුමේ නියමයන් තිබියදීත් සහ තවද, එකී උත්තරයේ 51 වැනි ජේදයේ 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගනු ලැබ ඇති පරිදි, ඉදිකිරිම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සකස් වූ මුල් සැලසුම් නොමැතිව තිබියදීත් සහ එකී උත්තරයේ 54 සහ 55 වැනි ජේදවල 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගනු ලැබ ඇති පරිදි විශේෂිත පරිමාණ පත්‍රය අවසාන වැඩමැනිම් නොමැති තිබියදීත්, සැපයීම් ගිවිසුමට ඇති 'ඒ' අක්ෂරය ලකුණු කළ ප්‍රදර්ශිතය නොමැතිව තිබියදීත්, 7 වැනි විත්තිකරු 1990.02.28 දිනැති ඔහුගේ එකී ලිපියේ ''සහතික දෙක'' හෝටලයේ ඉදිකිරිම් වැඩකටයුතු කොන්ත්‍රාත්තුවේ සියලු නියමයන්ට ආකූල වන බවට සෑහෙන ආවරණ වෙති'' යනුවෙන් අදහස් කරන්නේ ය.

(ඊ) පැමිණිලිකරු 7 වැනි විත්තිකරුගේ ඉංජිනේරු සහ හෝටල් ඉදිකිරිම් කර්මාන්ත කේෂ්ත්‍රයේ වෘත්තිමය ප්‍රවීනතාව සහ 7 වැනි විත්තිකරු 1990.02.28 දිනැති ඔහුගේ ලිපිය දීමේ දී, එකී සහතික දෙක (පී31ඒ) සහ (පී31බී) ඇතුළුව ඔහු විසින් පරික්ෂා කරනු ලැබූ ලේඛණවල ප්‍රමාණවත් භාවය පැමිණිලිකරු ප්‍රශ්න කරයි. වෘත්තීමය සම අධ්‍යක්ෂවරයෙකු වන පැමිණිලිකරුට මොන මොන යම් සඳහනක්වත් නොකර හෝ ඔහුගෙන් විමසීමක්වත් නොකර, 1989.12.13 දිනැති පැමිණිලිකරුගේ සංදේශය මත 7 වැනි විත්තිකරු එකී ලිපිය දුන්නේ ය.

(උ) ඉදිකිරිම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සැකසී තිබූ මුල් සැළසුම්, විශේෂිත වශයෙන් නියම කළ පරිමාණ පත්‍ර සහ අවසාන මැනීම්, සැපයීම් ගිවිසුමට ඇති ''ඒ'' අක්ෂරය ලකුණු කළ ප්‍රදර්ශකය ගෘහ භාණ්ඩ සවිකරණ උපකරණ සහ උපකරණ පිළිබඳ සසඳන ලද දේපල ලැයිස්තුවක් නොමැතිව 7 වැනි විත්තිකරු කෙසේ වුවත්, ''හෝටලයේ ඉදිකිරිම් වැඩකටයුතු කොන්ත්‍රාත්තුවේ සියළු නියමයන්ට අනුකූලවන අතර, අයිතිකරු කොන්ත්‍රාත්කරුට ඉතිරි මුදල් ගෙවීම සාධාරණ වන්නේ ය'' යනුවෙන් ප්‍රකාශ කිරිමට වෘත්තීමය වශයෙන් ප්‍රවීන පුද්ගලයෙකුට හැකියාවක් නැත.

(ඍ) 1990.02.28 දින එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පැමිණිලිකරු එම ලිපියෙහි අඩංගු කරුණුවලට වහාම විරුද්ධ විය. 7 වැනි වින්තිකරු එවලේම එය නැවත සලකා බැලීමට කැමැත්තෙන්ම ඉදිරිපත් විය.

(එ) හෝටල් කර්මාන්තයේ සෑහෙන පළපුරුද්දක් ඇති සහ එයට අනාවරණය වී සිටින තමනුත් වරලත් ගණකාධිකාරි වරයෙක් සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරයෙක් වන පැමිණිලිකරු 1989.12.13 වෙනි දිනැති සංදේශයෙන් 7 වැනි වින්තිකරුගෙන් <u>නොව</u> 3 වැනි වින්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන් හස්ටසාර සහ ඒකාන්ත පැහැදිලි කිරීම් ඉල්ලා සිටියේ ය.

(ඒ) එකී උත්තරයේ 33 වැනි ජේදයට වැඩිදුරටත් පිළිතුරු දෙමින් ප්‍රකාශ පත්‍රයේත් (පී5) නියම කර තිබූ එනම් වාහන 400 සඳහා වන කාර් නැවතුම්පොළක් (එනම් පතුල් මහල) සමඟ තට්ටු 22 දක්වා උසට තිබෙන, ගිවිසගත් සමාකෘතියට අනුව එකී හෝටලය නොතිබුණ නිසා සහ තවද, 3 වැනි වින්තිකාර සමාගමේ සරළ වූ වැඩ අවසාන සහ අවසාන සහතික සනාථ කිරීමට වැඩ පරිමාණ පත්‍ර හා වැඩ මැනීම් පත්‍ර නොමැතිවීම හා ප්‍රකාශ පත්‍රයේත් (පී5) එළදරව්කර ඇති සහ පාර්ශවකරුවන් ඇතුලත් වූ නොයෙක් ගිවිසුම්/කොන්ත්‍රාත්තු පරිදි ගිවිසුම්වලට හා නියමයන්ට අනුකූලව හෝටලය ගොඩනගා නැති නිසා, 1 වැනි සහ 2 වැනි වින්තිකරුවන්ට යම් ගෙවීමක්වත් කරනවාට පැමිණිලිකරු විරුද්ධවූ බව පැමිණිලිකරු ප්‍රකාශ කරන අතර, <u>එවැනි විරෝධතාවන් සඳහා පැමිණිලිකරුගේ හේතු 1989.12.13 දිනැති සංදේශයෙන් පැහැදිලිව ප්‍රකාශ කර ඇත.</u>

(ඔ) පැමිණිලිකරුගේ සංදේශයේ සඳහන් දැයට පටහැනි මේ සම්බන්ධව 1990.02.28 දින 7 වැනි වින්තිකරුගේ ක්‍රියාකලාපය, 1989.12.13 දිනැති, එනම් ඊට මාස 2 1/2 ට පසුව 1989.12.13 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ, එහිදී විරුද්ධත්වය නොවූ එකී සංදේශයේ ප්‍රකාශ කර ඇති සැළකිය යුතු ලෙසින් 1 වැනි සහ 2 වැනි වින්තිකාර සමාගම්වලට මුදල ගෙවනවාට පැමිණිලිකරු දැක්වූ විරුද්ධත්වයක් තිබියදී, 1 වැනි සහ 2 වැනි වින්තිකාර සමාගම්වල ගෙවීමක් කිරීමට යෝජනාවක් කර තිබූ, එකී එච්.ඔගාමි, 7 වැනි වින්තිකරු සහ 5 වැනි වින්තිකරු සහභාගී වූ 1990.01.26 දින මුදල් අමාත්‍යාංශයේ රැස්වීමට පසුවය.

(ඕ) එකී උත්තරයේ 35 වැනි ජේදයේ අවසාන වාක්‍යයට විශේෂයෙන්ම පිළිතුරු දෙමින්, පැමිණිලිකරු එය ප්‍රතික්ෂේප කරන අතර, එම සම්ප්‍රකාශය හිතාමතාම අසත්‍ය සහ නොමඟ යවන සුළු එකක් බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

එනම්,

(i) පැමිණිලිකරු එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 7 වැනි විත්තිකරුගේ 1990.02.28 දිනැති ලිපියට වහාම විරුද්ධ වූ අතර, 7 වැනි විත්තිකරු එය නැවත සළකා බැලීමට වහාම එකඟ වූයේ ය.

(ii) 1990.03.07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව සාක්ෂි දරණ පරිදි අනවසර ලෙස සංශෝධනය කළ ගෘහ නිර්මාණ සැළසුම් සොයගැනිම පැමිණිලිකරු 1990.03.07 දින 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දන්වා සිටියේ ය.

(iii) නොයෙකුත් කරුණු කඩ කිරිම් සහ ඒවායේ බරපතල සම්බන්ධතාවය දක්වමින් පැමිණිලිකරු 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 1990.04.24 දිනැති සංදේශය (පී45බී) ඉදිරිපත් කළේ ය. එහි පිටපත් සියලුම අධ්‍යක්ෂවරුන් වෙත යැව්වේ ය. තවද, පැමිණිලිකරු එම සංදේශයෙන්ම, එහි සඳහන් කර තිබූ අදාළ කරුණු බේරුම් කිරිමට ඉදිරිපත් කිරිමට යෝජනා කර තිබුනේ ය.

(iv) පැමිණිලිකරු ඊට පසුව නොනැවතී 1990.05.31, 1990.06.29, 1990.07.04 සහ 1990.08.29 දිනවල 4 වැනි විත්තිකාර සමාගම වෙත සංදේශ/ලියුම් ඉදිරිපත් කළේ ය. ඒවායේ පිටපත් අධ්‍යක්ෂකරුවන් වෙත යැව්වේ ය.

(ක) එකී උත්තරයේ 37, 50, 59 සහ 60 වැනි ජේදවල ඉහත ඕ(i), (iii), (iv) දරණ විෂයාංගයන්හි සඳහන් කර ඇති කරුණු පිළිගෙන ඇති 4 වැනි විත්තිකාර සමාගම සිය සමාගමේ එකී උත්තරයේ 35 වැනි ජේදයේ එකී සම්ප්‍රකාශය බොරු කරමින් සහ තවද, එකී උත්තරයේ 35 වැනි ජේදයේ ඇති සම්ප්‍රකාශයන්ට පටහැනිව, මෙහි ඉහත මීට කලින් ඇති උපජේදවල සඳහන් කර ඇති එකී නොයෙක් කරුණු සැළකිරිම් තිබියදිත් 7 වැනි විත්තිකරු 1990.02.28 දිනැති ඔහුගේ එකී ලිපියේ අඩංගු කරුණු සංශෝධනය කිරිමට අපොහොසත් වූවා පමණක් නොව, මෙහි ඉහත 3(ඇ) ජේදයේ සඳහන් කර ඇති 1990.12.20 දිනැති පැමිණිලිකරුගේ සංදේශයට ප්‍රතිචාර දැක්වීමටත් අපොහොසත් විය.

19. එකී උත්තරයේ 38, 39, 40 සහ 52 ජේදයන්ට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

(අ) 1990.02.16 වැනි දින ප.ව.3.30 ට මුදල් අමාත්‍යාංශයේ රැස්වීමකට සහභාගී වන ලෙසට මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 1990.02.02 දින සමාගම අමතන ලද ලිපියෙන් 4 වැනි විත්තිකාර සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන්ගෙන් ඉල්ලා සිටින ලදී. එකී ලිපිය 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී

1990.02.08 වැනි දින සභාගත කරන ලද අතර, මුදල් අමාත්‍යාංශයේ එකී රැස්වීමට පෙර 1990.02.16 වෙනි දින ප.ව.2.00 ට තවත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට තිරණය කරන ලදී. (පී39(අ) අවසාන පූර්ව සහ අවසාන ජේදයන් හි විෂය අංක.3) මෙම රැස්වීම් සියළුම අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමෙන් පවත්වන ලදී. (පී39(ආ) විෂය අංක.3, ජේදය 4)

(ආ) පසුව පිළිවෙළින් 1990.02.20, 1990.02.27, 1990.03.06 සහ 1990.03.08 වැනි දිනයන් හි මුදල් අමාත්‍යාංශයෙහි පසුව, ප්‍රතිඵල වශයෙන් පැවති සාකච්ඡාවන්හි ප්‍රගතිය, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පිළිවෙලින් 1990.02.28, 1990.03.07 සහ 1990.03.22 වැනි දිනවල වාර්තා කරන ලදී.

(ඇ) අනවසරයෙන් සංශෝධනය කරන ලද ගෘහ නිර්මාණ සැලසුම් සොයාගැනිම සහ 1990.03.07 වැනි දින එය 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළිදරව් කිරීමක් සමගම පැමිණිලිපතෙහි 49 වැනි ජේදයෙහි පැමිණිලිකරුගේ සම්ප්‍රකාශය ඔප්පු කරමින් මුදල් අමාත්‍යාංශයේ පැවති එකී සාකච්ඡා කර, නියම කර ගැනිම සහ සාකච්ඡාවන් එක්වරම අවසාන වූ අතර, අවසාන රැස්වීම 1990.03.08 වැනි දින පැවැත්විණි. තවද, පැමිණිලිපතෙහි 49(ආ) උප ජේදයේ වන සම්ප්‍රකාශ සම්බන්ධව බැලීමේ දී එකී නිළධාරී කාරක සභාවට 1990.08.22 දිනැති ලිපියක් හා 1990.09.26 දින දරණ ලිපියක් ද යනුවෙන් ලිපි දෙකක් ඉදිරිපත් කළ බව පැමිණිලිකර ප්‍රකාශ කරයි.

(ඈ) මුදල් අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ 1990.03.12 හා 1990.03.13 දිනැති ලිපි මගින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත මත පදනම් වූ 1990.03.22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවෙන් පෙනී යන පරිදි මුලින් සඳහන් (19(ආ)) උප ජේදයේ සඳහන් කරන ලද මුදල් අමාත්‍යාංශයේ පවත්වන ලද එකී රැස්විම්වල වාර්තා පිටපතක් ඇතුලත් කරමින්, 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් වෙත 4 වැනි විත්තිකාර සමාගම විසින් 1990.03.23 දින ඉදිරිපත් කරන ලද අතර, ඒ බැව් 4 වැනි විත්තිකාර සමාගමේ එකී ලිපියෙන් පෙනි යයි.

(ඉ) මුදල් අමාත්‍යාංශය විසින් සකස් කර 4 වැනි විත්තිකාර සමාගම වෙත එකී ලියුමට අමුණා ඉදිරිපත් කරන ලද ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනය කාමර එනම් අමුත්තන්ගේ කාමර 452 ක් සඳහාවීම සැලකිය යුතු වේ.

(ඊ) 4 වැනි විත්තිකාර සමාගම දන්නා ඉහත සඳහන් කරුණු අනුව පෙනී යන හැටියට සහ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා වලින් සාක්ෂි දරණ පරිදි පැමිණිලිපතෙහි 42 සහ 43 වෙනි ජේදයන්හි සම්ප්‍රකාශයන් දැනුම් තේරුම් නොමැතිව සිටි බවට වන 4 වැනි විත්තිකාර සමාගමේ උත්තවාද සැළකර සිටිම

හිතාමතාම අසත්‍යයක් බවත් නොමඟ යවන්නාවුත් 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස් කරුවන්ගේ යහපත සහ ප්‍රස්තුත රාජ්‍ය ඇපකර ලිපිය සම්බන්ධව බැලීමේ දී ශ්‍රී ලංකා මහජනතාවගේ යහපත සඳහා ද හේතු නොවේ. පැමිණිලිපතේ 49 වෙනි ජේදයේ සම්ප්‍රකාශයන් පිළිබඳව 4 වැනි විත්තිකාර සමාගම හොඳින් දැනුම් තේරුම් ඇතිව සිටි. මේ බැව් රජයෙන් පත්කළ අධ්‍යක්ෂ කේ.ෂන්මුගලිංගම් 1990.08.09 දින පැවති දේශිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී දැනුම් දී ඇත. (පී52(උ) විෂය අංක.15)

(උ) තවද, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත එච්.ඔගාමිගේ හැසිරීම් පිළිබඳව උත්තරදීමට හෝ පහදාදීමට සිද්ධිමය වශයෙන් හෝ නීතිමය වශයෙන් 4 වැනි විත්තිකාර සමාගමට හිමිකමක් නොමැති අතර, එය ද කර ඇත්තේ, ඒ පිළිබඳව පෞද්ගලිකව දැනුමක් හෝ එකී කරුණු පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමක් නොමැතිවය. එකී කරුණ 1990.08.09 දින දේශිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී වාර්තා කළේ ය. (පී52(පී) - 5 වැනි අංගය).

20. එකී උත්තරයේ 50 වැනි ජේදයට උත්තර දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටි.

(අ) 1990.03.07 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලද තදබල කඩකිරීම් පිළිබඳව 4 වැනි විත්තිකාර සමාගම ඵලදායි ලෙස ක්‍රියාත්මක වීමක් හෝ පියවර ගැනීමට කටයුතු නොකිරීම හේතුකොටගෙන, <u>එකී කරුණු බේරුම් කිරීම සඳහා යොමු කරන මෙන් තරයේ ඉල්ලා සිටිමින්</u> කඩ කිරීම් කීපයක් ඒවායේ තදබල සම්බන්ධතාවය පැහැදිලිව දක්වමින්, පැමිණිලිකරු විසින් 1990.04.24 වැනි දිනැති (එනම් ඉන්පසු සති 7 කට පසු) සංදේශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අමතන ලදී.

(ආ) පැමිණිලිකරුගේ 1990.04.24 දරණ එකී සංදේශයේ අඩංගු කරුණුවලට විරුද්ධව වෙනත් එක ද අධ්‍යක්ෂකවරයෙකු වත් අදහස් පළ නොකළ අතර, රජයෙන් පත්කළ අධ්‍යක්ෂ කේ.ෂන්මුගලිංගම් මහතා පැමිණිලිකරුගේ අදහස් සමඟ එකඟ වී ඇති බවට 1990.04.24 දින එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව (පී45ඒ) සාක්ෂි දරයි.

(ඇ) කඩ කිරීම් කීපයක් සහ ඒවායේ තදබල සම්බන්ධතාවයන් පිළිබඳ එම විත්තිකාර සමාගම දැනුම් තේරුම් නොමැතිව සිටින බවට උත්තරවාද කියා සිටිමට 4 වැනි විත්තිකාර සමාගම ප්‍රතිබන්ධනය වී ඇති බව ප්‍රකාශ කරයි.

(ඈ) ප්‍රධාන විසඳිය යුතු කරුණු අඩංගු වන, පැමිණිලි පතෙහි 47 වැනි ජේදයේ වැදගත් සම්ප්‍රකාශ 4 වැනි විත්තිකාර සමාගම ප්‍රතික්ෂේප නොකරන අතර, ඒවාට උත්තරදීම හිතාමතාම මගහරියි.

(ඉ) 4 වැනි විත්තිකාර සමාගම විසින් මෙම කඩකිරීම් කීපයක් සැලකිල්ලට ගැනීමට සහ ඒ පිළිබඳ ගනු ලැබූ ක්‍රියා මාර්ගය පහදා දීමට අපොහොසත් වෙමින් හා එම විත්තිකාර සමාගමෙන් ප්‍රකට අක්‍රීය භාවය සම්බන්ධව උත්තරදීමට අපොහොසත් වෙමින් දැන් එකී 47 වැනි ජේදයට උත්තරදීමට හිතාමතාම මගහරයි. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යවන ලද 1990.04.24 වැනි දිනැති සංදේශයෙන් (පී45බී) පැමිණිලිකරු විසින් යෝජනා කර ඇති පරිදි එම තදබල කරුණු සහ කඩකිරීම් කීපයක් ම බේරුම් කිරිම සඳහා යොමු කරනු නොලැබූයේ මන්දැයි පහදාදීමට අපොහොසත් වී ඇත.

21. එකී උත්තරයේ 57 සහ 58 වැනි ජේදවලට පිළිතුරු දෙමින්, පැමිණිලිපතේ 53 වැනි ජේදයේ ඇති සම්ප්‍රකාශයන් පැමිණිලිකරු නැවත නැවතත් ප්‍රකාශ කරමින්, පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි,

(අ) 4 වැනි විත්තිකරු හිතාමතාම උත්තරදීමට මගහැර ඇති වැදගත් කරුණු එකී සම්ප්‍රකාශවල අඩංගුව ඇති අතර, 4 වැනි විත්තිකාර සමාගම විසින් දැන් පිළිගනු ලැබ ඇති, හෙළිදරව් වී ඇති නොයෙක් වෙනස්කම් සහ කඩකිරීම් පිළිබඳව පෙනෙන අයුරින්, 4 වැනි විත්තිකාර සමාගමේ, එහි කොටස්කරුවන්ගේ සහ ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට 4 වැනි විත්තිකාර සමාගම කුමන ක්‍රියා මාර්ගයක් ගත්තේ ද යන්න ප්‍රකාශ කිරීමට 4 වැනි විත්තිකාර සමාගම අපොහොසත් වී ඇත.

(ආ) ප්‍රශ්නයට භාජනය වී ඇති රජයේ ඇප ලිපි සම්බන්ධයෙන් බැලීමේ දී ශ්‍රී ලංකාවේ මහජනතාවගේ අයිතිවාසිකම් ද ඇතුළත් වී තිබිය දීත් එකී බලවත් කරුණු සම්බන්ධව විභාගයක් පවා පැවැත්වීමට 4 වැනි විත්තිකාර සමාගම සිය යුතුකම සහ වගකීම අනුව ක්‍රියා කිරීමට අපොහොසත්ව පැහැර හැර ඇත.

(ඇ) අදාළ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේම සටහනින් පෙනෙන පරිදි පැමිණිලිපතේ 54(අ) උප ජේදයේ තිබෙන සම්ප්‍රකාශයන් ස්වයං ප්‍රත්‍යක්ෂ වේ. 4 වැනි විත්තිකාර සමාගම කුමන ක්‍රියා මාර්ගයක් ගත්තේ ද එකී බලවත් කරුණු සම්බන්ධව විභාගයක් පැවැත්වීමට සහ 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් උත්තරදීමට සහ වගකීමට හසුකර ගැනිමට පවා 4 වැනි විත්තිකාර සමාගම අපොහොසත්වූයේ මන්ද යන්න ප්‍රකාශ කිරීමට 4 වැනි විත්තිකාර සමාගමට නොහැකිවී ඇත.

22. එකී උත්තරයේ 61 වැනි ජේදයට උත්තර දෙමින් පැමිණිලිකරු මෙසේ ප්‍රකාශ කරයි.

(අ) මේ සම්බන්ධයෙන් 4 වැනි විත්තිකාර සමාගම විසින් දී ඇති උත්තර හිතාමතාම අසත්‍ය වේ.

(ආ) 1985.07.25 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සටහන් කරන ලද 1985.07.22 දින සිය ලිපිය මගින් 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය මත වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාගත යුතු යයි ඉල්ලා සිටි බව එකී උත්තරයේ 10 වැනි ජේදයෙන් 4 වැනි විත්තිකාර සමාගම පිළිගෙන ඇත.

(ඇ) 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගෙන ඇති පරිදි 1987.06.08 දිනැති එකී අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ සාක්ෂි වන පරිදි 1987.04.30 වැනි දින හෝටලය හිල්ටන් ආයතනයට භාරදුන් බව 5 වැනි විත්තිකාර සමාගම 1987.06.08 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළේ ය, යන්න 4 වැනි විත්තිකාර සමාගම එකී උත්තරයේ 12 වැනි ජේදයේ පිළිගෙන ඇත.

(ඈ) 1987.06.08 වැනි දින පැවති එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වල 1987 අප්‍රේල් මාසය සඳහා වන සහතික කරන ලද එකී මාසික වාර්තාව (පී53(අ)) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ විෂය අංක.10 (පී23) හි වාර්තාවී ඇති පරිදි, සභාගත කර ඇත.

(ඉ) කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල (පී12) 11(1) වගන්තිය සහ සැලසුම් සහ අධීක්ෂණ කොන්ත්‍රාත්තුවේ (පී14'අ') ඇමුණුමෙහි බී 4.04 වගන්තිය මඟින් 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් විසින් එවැනි මාසික වාර්තා 4 වැනි විත්තිකාර සමාගම වෙත ඉදිරිපත් කිරීම නියම කර ඇත.

(ඊ) එමනිසා 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් විසින් ඉදිරිපත් කරන සහතික කරන ලද මාසික වාර්තා 4 වැනි විත්තිකාර සමාගම විසින් ප්‍රතික්ෂේප කිරීම දැන් ප්‍රතිබන්ධනය කර ඇත.

(උ) 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් විසින් සහතික කර ඉදිරිපත් කරන මෙම මාසික වාර්තාවලින් සාක්ෂි දරණ පරිදි හෝටලයට ඇත්තේ මහල් 20 ක් පමණක් බව තහවුරු වී ඇති අතර, මීට විරුද්ධ වශයෙන් 1 වැනි, 2 වැනි සහ 4 වැනි විත්තිකාර සමාගම් අතරේ ගිවිසුමට එළඹි 3 වැනි විත්තිකාර සමාගම විසින් අනු අත්සන් කරන ලද ඉදිරිකිරීම් ගිවිසුමේ (පී11) මහල් 22 ක් නියම කර ඇති අතර, එම කරුණම පමණක් පැමිණිල්ලේ නඩුව ඔප්පු කරයි.

(ඉ) 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි විත්තිකාර සමාගම් විසින් එය ප්‍රතික්ෂේප කිරීම දැන් ප්‍රතිබන්ධනය කරයි.

(ඔ) 4 වැනි විත්තිකාර සමාගම, මෙම තදබල සහ වැදගත් කරුණු පිළිබඳ අසත්‍ය ලෙස දැනුම් තේරුම් නොමැති බවට උත්තරවාද සැළකිරීම් මගින් තමාගේම යහපත සහ එහි කොටස්කරුවන්ගේත් යහපතට සහ එමෙන්ම ප්‍රස්තුත රාජ්‍ය ඇපකර ලිපිය සම්බන්ධව බැලීමේ දී ශ්‍රී ලංකා රජයේ සහ මහජනයාගේ යහපතට පටහැනි අන්දමින් කටයුතු කරයි.

23. එකී උත්තරයේ 63 වැනි ඡේදයට පිළිතුරු දෙමින්, පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි,

(අ) මෙම උත්තරවාදයේ 27 වැනි ඡේදයේ සැළකර සිටින උපලේඛණයේ පැහැදිලි ලෙස දක්වා ඇති පරිදි 4 වැනි විත්තිකාර සමාගම නොයෙක් වැදගත් කරුණු පිළිබඳ සම්ප්‍රකාශයන් සහ බලවත් කඩකිරීම් පිළිගෙන ඇත.

(ආ) දී ඇති කරුණු තිබෙන හැටියට 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් විසින් ඉල්ලනු ලැබ ඇති ණය මුදල් ආපසු ගෙවීම නොහැකි බවත්, 4 වැනි විත්තිකාර සමාගම එකී උත්තරයේ 14 වැනි ඡේදයේ පිළිගෙන ඇත.

(ඇ) ඉහත සඳහන් කරුණු එසේ තිබියදීත්, 4 වැනි විත්තිකාර සමාගම විසින් යම් පරික්ෂණ නොපැවැත්වීම සහ/හෝ යම් නිදහසට කරුණු ඉල්ලා නොසිටීම සම්බන්ධ 4 වැනි විත්තිකාර සමාගමේ සැළකිය යුතු අක්‍රියතාවය පැහැදිලි කර නැති අතර, තවද, එසේ කිරීම 4 වැනි විත්තිකාර සමාගමේ ම සහ එකී කොටස්කරුවන්ගේ සහ ප්‍රශ්නයට යටත්ව තිබෙන රාජ්‍ය ඇපකර ලිපි සම්බන්ධව බැලීමේ දී ශ්‍රී ලංකාවේ මහජනයාගේ යහපත උදෙසා නොවෙයි.

(ඈ) අධිකරණය ඉදිරියේ ඇති කරුණුම සහ ලියකියවිලි ම සාක්ෂි දරණ අතර, ඒවා පැමිණිලිපතේ 58 වැනි ඡේදයේ ප්‍රකාශ කර ඇති පරිදි, පැමිණිලිකරුගේ තත්ත්වය නිදොස් බවත්, පැමිණිලිකරුගේ ක්‍රියාවන් සහ හැසිරීම, 4 වැනි විත්තිකාර සමාගමේ එහි කොටස්කරුවන්ගේ සහ මහජනතාවගේත් යහපත සඳහා අනුරූප වන සේ පැවැති බවත් ඔප්පු කරයි.

24. එකී උත්තරයේ 64 වැනි සහ 65 වැනි ඡේදයන්ට උත්තර දෙමින් පැමිණිලිකරු මෙසේ ප්‍රකාශ කරයි. එකී 64 වැනි ඡේදයේ සම්ප්‍රකාශ හිතාමතාම අසත්‍ය සහ වංක ඒවා වන අතර, ඒවා සනාථ කිරීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් නැති අතර, එම උත්තරයේම 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගන්නා ලද කරුණු සහ විෂමතාවයන් පිළිබඳ වැදගත්

සම්ප්‍රකාශ කීපයක් මුළුමනින් නොසලකා හරිමින් හේතු දක්වා ඇති අතර, එකී එම උත්තරයේම 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගන්නා ලද සම්ප්‍රකාශ කීපයකින්ම පෙනී යන පරිදි බැලූ බැල්මට 4 වැනි විත්තිකාර සමාගමේ සැළකිය යුතු අක්‍රියභාවය වසන් කිරීමට කටයුතු කර ඇත.

25. තවදුරටත් පිළිතුරු දෙමින් පැමිණිලිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි,

(අ) මෙහිදී ඉහත සාක්ෂි දැරූ පරිදි, කලින් සැළසුම් කළ පරිදි සහ බැඳුණු <u>පරිදි එකී හෝටලය කාමර 452 කින් සමන්විත වූයේය යනුවෙන් 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කිසි විටෙකත් තීරණයකට නොඑළඹියේ ය.</u> හුදෙක්ම මෙම කාරණය මෙම නඩුව පැවරූ කාලය දක්වා ම ගිවිසුමට භාජනය වෙමින් තිබූ අතර, තීරණයට එළඹ නොතිබුණි.

(ආ) එකී උත්තරයේ 51 වැනි ඡේදයෙහි එකී මුල් සැළසුම් නොතිබීම පිළිබඳ 4 වැනි විත්තිකාර සමාගමේ සිය පිළිගැනීම, පිළිගත් පරිදි විශේෂිත වැඩ පරිමාණ පත්‍ර සහ අවසාන මැනීම නොතිබීම එකී උත්තරයේ 54 සහ 55 වැනි ඡේදවල පිළිගත් පරිදි ගෘහ භාණ්ඩ සවිකරණ උපකරණ සහ උපකරණ පිළිබඳව ගණන් තැබූ සහ සසඳන ලද දේපල ලැයිස්තුව නොතිබීම, පිළිගත් පරිදි සැපයීම් ගිවිසුමට ඇති 'ඒ' අක්ෂරය ලකුණු කළ ප්‍රදර්ශිතයේ නොතිබීම යන කරුණු සම්බන්ධව බැලීමේ දී හෝටලය මුල් සැලසුම්වලට සහ නියමයන්ට අනුකූලතා වන්නේ ද යන්න අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මොන මොන සාකච්ඡාවක්වත් කිසි විටෙකත් ඇති නොවිය හැකිය.

(ඇ) මීට පරස්පර විරෝධීව, සාකච්ඡා මඟින්ය යන්න කෙසේ වෙතත්, 1988 අගෝස්තු මාසයේ දී 3 වැනි විත්තිකාර සමාගම අවසාන සහතිකය නිකුත් කිරීමට පෙර හෝටල ගොඩනැගිල්ල විභාග කර පරීක්ෂා කිරීමට ස්වාධීන ඉංජිනේරුවකු පත් කිරීමට එවකට රජයෙන් පත් කළ අධ්‍යක්ෂ (වරලත් ගණකාධිකාරි සහ අර්නස්ට් සහ යං ආයතනයේ ප්‍රධාන හවුල්කරු) එම්.ටී.එල්.ප්‍රනාන්දු විසින් 1988 මැයි මසදී පසුව කළ යෝජනාවේ ප්‍රතිඵලයක් වශයෙන් එකී හෝටලය ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කළ අවස්ථාවේ දීම වාගේ සහ 1987 දෙසැම්බර් සහ 1988 ජනවාරි මාසවලදී 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දී පැමිණිලිකරු විසින් ප්‍රශ්න කරන ලද අමුත්තන්ගේ කාමර ගණනේ වෙනසම පිළිබඳ කාරණය 3 වැනි විත්තිකාර සමාගම විසින් අවසාන සහතිකය නිකුත් කිරීමට පෙර 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇති වූ එකම සාකච්ඡාව විය. ඇත්ත වශයෙන්ම, කෙසේ වෙතත්, මෙය 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගමේ නියෝජිත එච්.ඔගාමි විරුද්ධවීමෙන් සහ 4 වැනි විත්තිකාර සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ 5 වැනි විත්තිකරු විසින් ස්තුති කරනු ලැබ ඇති, 7 වැනි

විත්තිකරු විසින් 1988.01.08 දිනැති ඔහුගේ ලිපිය මඟින් මෙය වළක්වාලන ලදී. 1988.08.12 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවේ (පී30පී) 3බී විෂය අංකය බලන්න. කෙසේ වෙතත්, පැමිණිලිකරු 1990 මාර්තු මාසයේ මුදල් අමාත්‍යාංශයේදී සොයාගත් 1985 ජුලි මාසයේ මුල් සැළසුම් සංශෝධනය පරිදි මුල් සැළසුම් ඇත්ත වශයෙන්ම සංශෝධනය කළ බවට මොන මොන කිසිම හෙළි කිරිමක්වත් නැතිව 3 වැනි විත්තිකාර සමාගම විසින් අවසාන සහතික නිකුත් කරන ලද්දේ ඊට පසුව 1988.08.25 වැනි දින පමණකී.

(ඈ) පිළිගත් පරිදි වෙනත් දේ අතර, විශේෂිත පරිමාණ බිල්පත්‍ර සහ අවසාන මැනීම් නොමැතිව නියම සහතික නොවන බවට දැන් සොයාගෙන ඇති වෘත්තීමය ගෘහ නිර්මාණ ශිල්පීන් වන 3 වැනි විත්තිකාර සමාගමේ සහතික මත විශ්වාසය තැබීමේ පදනම පමණක් 4 වැනි විත්තිකාර සමාගම එකී හෝටල් ගොඩනැගිල්ල භාරගන්නා ලද අතර, තවද, 4 වැනි විත්තිකාර සමාගම විශ්වාසය තැබූ ඔවුන්ගේ එකී සහතිකවල එකී ගිවිසුම්වල/කොන්ත්‍රාත්වල ඇති නොයෙක් කොන්දේසි කඩකරමින් සහ උල්ලංඝනය කරමින් 4 වැනි විත්තිකාර සමාගමේ ප්‍රකාශිත අවසරය සහ උපදෙස් නැතිව 3 වැනි විත්තිකාර සමාගම 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් සමඟ අපසහායකත්වයෙන් ක්‍රියාකාරි නව සැළසුම් කට්ටලයක් නැවත අඳ සකස් කර ඒ බව 4 වැනි විත්තිකාර සමාගමට හෙළිදරව් නොකර, ඔවුන්ගේ සහතිකවල හිතාමතාම සඟවා ඇත. සංශෝධනයන්, සංශෝධිත සැලැස්ම මත ඇඳ විස්තරව දක්වා නැත. කෙසේ වෙතත් 3 වැනි විත්තිකාර සමාගම මුලින් අනුමතකළ ගෘහ නිර්මාණ සැළසුම්වලට අරමුණු කළ අනවසර සංශෝධන/වෙනස්කම් විස්තර කරමින් උපලේඛණයක් (පී23බී) නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කර ඇත.

(ඉ) මුදල් අමාත්‍යාංශය ඔවුන්ගේ 1990.03.12, 1990.03.13 ලිපිවලින් උපදෙස් දෙන ලද පරිදි, මුලින් ගිවිස ගත් පරිදි, කාමර 452 ක් නොමැති බව නැවත වරක් පෙන්වා දෙමින්, 4 වැනි විත්තිකාර සමාගම 1990.03.23 දිනැති ලිපියක් 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් වෙත ඉදිරිපත් කරන ලදී. මුලින් ගිවිස ගත් අමුත්තන්ගේ කාමර ගණන වන කාමර 452 ක මත පදනම් වූ මුලින් බලාපොරොත්තු වූ ආදායම් මට්ටම විදහා දැක්වීමට, මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද එකී ලිපියට අමුණා තිබූ ලාභ උපයන සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනය, අමුත්තන්ගේ කාමර 452 ක මත පදනම් විය.

(ඊ) 1990 පෙබරවාරි සහ මාර්තු මාසවලදී මුදල් අමාත්‍යාංශයේ සාකච්ඡා කීපයක් පැවැත් විණි. එම සාකච්ඡාවලදී කාමර ගණන මහල් ගණනේ පතුල් මාලයේ සහ ආවරණ වූ කාර් නැවතුම් කුටි ගණනේ වෙනස මතු කරනු ලැබී ය. 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් මේ අවස්ථාවේදීවත් මුල් සැළසුම් ඇත්තවශයෙන්ම

සංශෝධනය කර ඇති බව හෙළි නොකළේ ය. කෙසේ වෙතත්, 1990 මාර්තු මාසයේ දී අනවසර ලෙස සංශෝධනය කළ සැලසුම් සොයාගත් විට සහ ඒ බව 1990.03.17 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී හෙළි කළ විට, එකී සාකච්ඡා සහ කතා බහ හදිසියේ නතර විණි.

(උ) ඉහත පෙනෙන කරුණු සම්බන්ධව බැලීමේ දී සහ වෙනත් නොයෙක් වැදගත් කරුණු අතර, එකී නොයෙක් කරුණු සම්බන්ධ යම් විමසීමක්වත් නොකර එකී උත්තරයේ 64 වැනි ඡේදයෙහි ඉදිරිපත් කර ඇති උත්තර වාචකය සිය කැමැත්තෙන්ම ඉදිරිපත් කිරීමට 4 වැනි විත්තිකාර සමාගමට මොන මොන පදනමක්වත් නොමැති අතර, මේ සම්බන්ධයෙන් බැලීමේ දී එකී උත්තරයේ 65(අ) උප වගන්තියේ ඉදිරිපත් කර ඇති 4 වැනි විත්තිකාර සමාගමේ නිර්ව්‍යාපත්වයම විශේෂයෙන්ම වඩාත්ම මුල් ගෘහ නිර්මාණ සැලසුම් සංශෝධනය කිරීම කිසි විටෙකවත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොවූ හෙයින්, බොහෝදුරට ප්‍රශ්නයට තුඩු දෙයි.

(ඌ) 4 වැනි විත්තිකාර සමාගම විශේෂිතව සහ ප්‍රකාශිතව ම යම් සහනයක්වත් ආයාචනයක්වත් නැත. ඒ වෙනුවට බැඳීමක් නැති ප්‍රකාශයක් එකී උත්තරයේ 65 වැනි ඡේදයෙහි ඉදිරිපත් කර ඇති අතර, එමනිසා උත්තරය නොපැහැදිලිය, ඍජු නොවේ.

26. එකී උත්තරයේ 42, 43 සහ 51 වැනි ඡේදවලට පිළිතුරු දෙමින්, සහ එහි 37, 50 සහ 63 වැනි ඡේදවලට තවදුරටත් පිළිතුරු දෙමින් පැමිණිලිකරු මෙසේ ප්‍රකාශ කරයි.

(අ) මුල් ගෘහ නිර්මාණ සැලසුම් ඉදිකිරීම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සෑදී තිබුණු අතර, එකී අයෝජන ගිවිසුමේ 17.01.(9) වගන්තියේ නියම කර ඇති පරිදි, වෙනත් දේ අතර, එකී ඉදිකිරීමේ ගිවිසුමද ඇතුළත්ව ඇති කිසියම් ගිවිසුමකට කිසියම් සංශෝධනයක් සඳහා එකී අයෝජන ගිවිසුමේ 6.10(iv) එෆ් වගන්තියේ එකී ණයට ඇපකරු වන ශ්‍රී ලංකා රජයත් ඇතුළත් වූ එකී ආයෝජන ගිවිසුමේ සියලු පාර්ශවකරුවන්ගේ ලිඛිත එකගත්වය අවශ්‍ය බවට විශේෂිතව විධිවිධාන සලසා තිබූ අතර තවද, එකී අයෝජන ගිවිසුම 12.02 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා රජය ඇතුළුව එකී අයෝජන ගිවිසුමේ සියලු පාර්ශවකරුවන් විසින් ලිඛිතව ස්ථිර කළහොත් මිස, එකී ආයෝජන ගිවිසුමට කරන එවැනි සංශෝධනය ඵලදායි විය නොහැකිය.

(ආ) ඉදි කිරීම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සෑදී තිබුනු පොදු කොන්දේසි ගිවිසුමේ, 18(2) වගන්තිය, යම් වෙනස්කමක්වත් සිදුකළ හැක්කේ එකගත්වය මත පමණක් වන අතර, එය ද 4 වැනි විත්තිකාර සමාගමට ආර්ථික වශයෙන්

වාසිදායක නම් පමණක් යනුවෙන් නියම කර ඇති අතර, තවද, (එකී ආයෝජන ගිවිසුමේ 17.01(9) වගන්තියෙන් ඇතුළත් කර ඇති) සැළසුම් සහ අධික්ෂණ ගිවිසුමේ 6.02 වගන්තියේ 4 වැනි විත්තිකාර සමාගමේ ලිඛිත අනුමැතිය නැතිව යම් වෙනස්කමක්වත් සිදු කිරිමට 3 වැනි විත්තිකාර සමාගමට බලයක් නොමැති බවට නියම කර ඇත. තවද ඉදිකිරිමේ ගිවිසුමේ 1(1)(කිව්) වගන්තියෙහි ''අනුමත කළ''/''අනුමැතිය'' යන්නෙහි අර්ථය ලිඛිතව ''අනුමත කළ''/''අනුමැතිය'' යනුවෙන් අර්ථය නියම කර දක්වා තිබේ.

(ඇ) මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් වශයෙන් අරමුණු කරගෙන 3 වැනි විත්තිකාර සමාගම විසින් මෙම නඩුවේ ඉදිරිපත් කර ගොනු කර ඇති 3ආර්1 ලියවිල්ල, 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගනු ලැබු පරිදි, 1984 මාර්තු මස ඉදිකිරිම් කටයුතු ආරම්භ කරනු  ලැබ ඇති 1984 මාර්තු මස නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ <u>මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් නොවන බව පිළිගනිමින්, මෙම අවස්ථාවේදී මුල් ගෘහ නිර්මාණ සැළසුම් නැති බවට,</u> හා තවද, 1984.01.07 දින 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එකී මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් එකී ගිවිසුම්/කොන්ත්‍රාත් සහ 1 වැනි විත්තිකාර සමාගමේ ලාභ උපදවන පූර්වානුමාන ප්‍රකාශ පත්‍රය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණය අනුමත කිරිමේ දී, එකී හෝටලය කාමර 452 කින් යුත්ත විය යුතුය යන්න සහ වාහන 400 ක් සඳහා වන ආවරණය කළ කාර් නැවතුම් පොළක් එනම්, පතුල් මාලය සහ තට්ටු 22 ඇතුළුවන සේ පී5 ප්‍රකාශ පත්‍රයේ (ඉදිකිරිමේ ගිවිසුමේ ඇතුළත් නියම කර ඇති පරිදි) එසේ නියම කරනු ලැබ ඇති බවට සටහන් කරගෙන ඇතැයි යන්න 4 වැනි විත්තකා ර සමාගම එකී උත්තරයේ 51 වැනි ජේදයේ පිළිගෙන ඇත.

(ඈ) 1990 මාර්තු මාසයේ සොයාගත් සැළසුම්, <u>කෙසේ වුවත්, ඒ මත සංශෝධනයන් නිරූපනය කර නැති,</u> සංශෝධනය කළ සැළසුම් කට්ටලයක් බවත්, 3 වැනි විත්තිකාර සමාගමේ වැඩ අවසන් සහතිකය සහ අවසාන සහතිකය හා නාගරික සංවර්ධන අධිකාරියේ අනුකුලතා සහතිකය <u>1986.04.29</u> දින ''සංශෝධිත සැළසුමක්'' වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද <u>1985.07.15</u> දිනැති 3 වැනි විත්තිකාර සමාගමේ මෙම සංශෝධිත සැළසුම්වලට සම්බන්ධ බව 4 වැනි විත්තිකාර සමාගම පිළිගන්නා අතර, එකී දින දෙකට අතර, <u>1985.10.18</u> දින 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල ඉදිකිරිම් වැඩ බිම් කාර්යාලයේ ගින්නක් වාර්තා වී ඇති අතර, සියලු සැළසුම් චිත්‍ර හා ලියකියවිලි ගිනිගෙන දැවී ගිය බව තවදුරටත් පිළිගන්නා අතර, 4 වැනි විත්තිකාර සමාගම පිළිගනු ලැබ ඇති පරිදි, මේ අවස්ථාවේ දී පවා එකී මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් නැති බවත්, 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් දිගටම සඟවාගෙන සිට, මෙහි ඉහත සඳහන් කර ඇති පරිදි, මුල් ගෘහ නිර්මාණ

සැලසුම් ඇත්තවශයෙන්ම සංශෝධනය කර ඇති බව පිලිගන්නේ යැයි පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

(ඉ) මෙහි ඉහත (අ) සහ (ආ) උපපේදවල සඳහන් කර ඇති පරිදි, මුල් ගෘහ නිර්මාණ සැලසුම් පිළිබඳ එකී සංශෝධන අනුමත කිරීමට සහ ඒවාට බලයදීමට අවශ්‍ය වූ <u>ලිඛිත සම්මුති</u> ඉදිරිපත් කිරීමට 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලටත්, 4 වැනි විත්තිකාර සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් වන අනෙක් විත්තිකරුවන්ටත් නොහැකි වී ඇති අතර, 1985.07.15 දිනැති 3 වැනි විත්තිකාර සමාගමේ එකී සංශෝධිත සැලසුම් අනුමත කිරීම සම්බන්ධව හෝ එවැනි යම් අනුමැතියක්වත් ලිඛිතව අවශ්‍යව තිබියදී, මුල් ගෘහ නිර්මාණ සැලසුම්වලට යම් සංශෝධනයක්වත් හෝ වෙනස්කමක්වත් පිළිබඳ බලයදීම සහ/හෝ අනුමත කිරීම සම්බන්ධව 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පිළිබඳ යම් වාර්තාවක්වත් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට 4 වැනි විත්තිකාර සමාගමට නොහැකි වී ඇත.

(ඊ) මීට විරුද්ධව, ඉදිකිරීමේ කටයුතු පිළිබඳ ප්‍රගතිය මත 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා ගැනීමට තිබිය යුතු යැයි ඉල්ලා 1985.07.25 දින 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දී පැමිණිලිකරු ලිඛිතව කළ ඉල්ලීම් (පී21ඒ සහ පී21බී) තිබියදීත්, <u>ඒ මොහොතේදීම වාගේ එනම්,</u> 1985 ජුලි මාසයේ දී, එම <u>1985 ජුලි මස සංශෝධිත සැලසුම්</u> 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට හිතාමතාම සඟවා ඇති බව සහ හෙළිදරව් කර නොමැති බව අධිකරණය ඉදිරියේ තබා ඇති සාක්ෂි පෙන්නුම් කරයි.

(උ) එකී හෝටල් දේපල අයිතිකරු වන 4 වැනි විත්තිකරු සමාගම මෙම නඩුවේම විසඳිය යුතු ප්‍රශ්න තිබියදීත්, ඒ ගැන නොසලකා, මුල් ගෘහ නිර්මාණ සැලසුම්වලට එකී සංශෝධන හෝ වෙනස්කම් 4 වැනි විත්තිකාර සමාගම විසින් අනුමත කරන ලද බව සහ/හෝ ඒවා කිරීමට අවසරය දෙන ලද බවට පිළිගෙන නැත.

(ඌ) මෙහි (අ) සහ (ආ) උපපේදවල සඳහන් කර ඇති එකී ලිඛිත සම්මුතිය සඳහා අවශ්‍යතාවය එසේ තිබියදීත්, එකී දේපල අයිතිකරුවන <u>4 වැනි විත්තිකාර සමාගමේ ප්‍රකාශිත උචිත අනුමැතිය සහ අවසරය නැතිව</u> මුල් ගෘහ නිර්මාණ සැලසුම්වලට එකී සංශෝධනයන් සහ/හෝ වෙනස්කම් කිරීමට 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වල පොදු නීතියෙන් ඉඩකඩ නොලැබෙන්නේ ය.

27. එකී උත්තරයට සමස්ථයක් වශයෙන් තවදුරටත් පිළිතුරු දෙමින්, 4 වැනි විත්තිකාර සමාගම පැමිණිලිපතෙහි සඳහන් කර ඇති සමහර සම්ප්‍රකාශයන්

පිළිගෙන සහ/හෝ ඒවා පිළිබඳ සිය දැනුම් තේරුම් ඇති බව සැලකර ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කරන අතර, පැමිණිලිකරු මෙම ගරු අධිකරණයට පහසුවෙන් බලාගැනීම සඳහා වන අරමුණෙන්, උත්තරයේ, පැමිණිලිපතට අනුරූප වන ජේදවල අඩංගුව තිබෙන වැදගත් කරුණු දක්වමින්, එකී උත්තරයේ තිබෙන අදාළ ජේදයන්ට සම්බන්ධකම ඇති එවැනි සම්ප්‍රකාශයන් වෙනම උපලේඛණයක දක්වා ඇති අතර, එම උපලේඛණය මෙම වැඩිදුර උත්තරවාදයට අමුණා ඇති මෙහි කොටසක් වශයෙන් සැලකර ඇති අතර, එකී සම්ප්‍රකාශවල තිබෙන නොයෙක් බලවත් කරුණු පිළිබඳ 4 වැනි විත්තිකාර සමාගමේ පිළිගැනීම් සහ පිළිගත් දැනුම් තේරුම් ඇති බව එසේ තිබියදීත්, 4 වැනි විත්තිකාර සමාගම සිය සමාගමේ ම සහ ශ්‍රී ලංකා රජය සහ මහජනයා ඇතුළුව එහි කොටස් අයිතිකරුවන්ගේ යහපත උදෙසා එකී නොයෙක් කරුණු සම්බන්ධව මොන මොන යම් විභාගයක්වත් පැවැත්වීමට හා ඒවා සඳහා වගකිවයුතු සහ උත්තරදිය යුතු අයවලුන් තීරණය කිරීමට නොසලකා පැහැර හරිනු ලැබ ඇති අතර, 4 වැනි විත්තිකාර සමාගම සිය අක්‍රියභාවය ගැන මොන මොන යම් නිදහසට කරුණුවත් ඉදිරිපත් කර නැති බව පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කරයි.

28. සමස්ථයක් වශයෙන් එකී උත්තරයට තවදුරටත් පිළිතුරු දෙමින්, එකී උත්තරය සමස්ථයක් වශයෙන්, මෙම නඩුවේ පාර්ශවකරුවන් අතර පැන නැග තිබෙන විසඳිය යුතු ප්‍රශ්න සම්පූර්ණ සහ ඵලදායි ලෙස මෙම ගරු අධිකරණයට නිරාකරණය කිරීමට හැකිවන සේ, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 75(ඈ) වගන්තියෙන් අවශ්‍ය වන පරිදි පැමිණිලි පතේ ඉදිරිපත් කර ඇති වෙනත් බලවත් සහ වැදගත් කරුණු ගණනාවක් සම්බන්ධයෙන් විශේෂිත සම්ප්‍රකාශයයන් එකී උත්තරයේ අඩංගු නොවන අතර, එමනිසා පැමිණිලිපතේ ඇති එකී සම්ප්‍රකාශයන්ට සුදුසු සහ ඵලදායි ලෙස උත්තර සැපයීමට 4 වැනි විත්තිකාර සමාගමට හැකිවන සේ, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 77 වැනි වගන්තිය යටතේ සහ ප්‍රකාර එකී උත්තරය 4 වැනි විත්තිකාර සමාගම වෙත ආපසු දෙන ලෙසට පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

එබැවින්,

(අ) 4 වැනි විත්තිකාර සමාගම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 75 සහ 77 වැනි වගන්ති අනුකූලව කටයුතු කිරීමට හැකිවන සේ ගරු අධිකරණය කාරුණිකව එකී උත්තරය 4 වැනි විත්තිකාර සමාගම වෙත ආපසු දෙන ලෙසට,

(ආ) නඩු ගාස්තු සහ මෙම ගරු අධිකරණයට මැනවැයි පෙනෙන එවැනි සහ තවත් සහන ලබාදෙන ලෙසට,

පැමිණිලිකරු අයැද සිටියි.

පැමිණිලිකරුගේ නීතිඥයින්.

<u>වැඩිදුර උත්තරවාදවලට අමුණා ඇති ලියවිලි.</u>

1. මෙම උත්තරවාදවල 27 වැනි ජේදයේ සඳහන් කර ඇති (පිටු 1 - 11 දක්වා තිබෙන) උපෙල්බණය.

පැමිණිලිකරුගේ නිතිඥයින්.

නීතිඥ ඒ.ඒ.ඇම්.ඉලියාස්,
නීතිඥ ඇස්.ශ්‍රිස්කාන්ත,
ජනාධිපති නීතිඥ කේ.කනග්-ඊස්වරන්,
රාජනීතිඥ පී.නවරත්නරාජ
විසින් සකස් කරන ලදී.

වැඩිදුර උත්තරවාදයේ 27 වැනි ජේදයේ සැළකර ඇති උපලේඛණය.

| | |
|---|---|
| එකී උත්තරයේ ජේද අංකය. | 4 වැනි විත්තිකාර සමාගම විසින් සිය උත්තරයෙන් පිළිගනු ලැබ ඇති සහ/හෝ දැනුම් තේරුම් ඇතිව සිටිනු ලබන බව ප්‍රකාශ කරන වැදගත් කරුණු. |
| 2 | 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම පූර්ණ නේවාසික විධායක අධ්‍යක්ෂවරයෙකු ඇතිව 4 වැනි විත්තිකාර සමාගමේ පරිපාලන සහ එදිනෙදා කටයුතු කළමණාකරණය කරමින් සහ පාලනය කරමින්, එකී 4 වැනි විත්තිකාර සමාගමේ ප්‍රවර්ධකයින් වශයෙන් ද සිටි බව ඇතුළුව 1 වැනි විත්තිකාර සමාගම බොහෝ කාර්ය භාරයන් හි එක්ව හා වෙන් වෙන්ව ක්‍රියා කළේය යන්න දැනුම් තේරුම් ඇතිව සිටින බව පිළිගනි.<br><br>ප්‍රකාශ පත්‍රය (පී5) පිළිබඳව සහ ආරම්භයේ සිටම පැමිණිලිකරුගේ ක්‍රියකාරි සහභාගීත්වය දැනුම් තේරුම් ඇතිව සිටින බව පිළිගනි. |
| 4 | සියලුම ගිවිසගත් මිල ගණන් නිශ්චිත වශයෙන් දක්වන ලද 1983.03.30 දිනැති ප්‍රාථමික ගිවිසුම (පී6) සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට ඉදිකිරීම් සඳහා වන 1983.03.30 වැනි දිනම දරණ ප්‍රදාන ලිපිය නිකුත් කිරීම පිළිගනි.<br><br>කෙසේ වෙතත්, ප්‍රකාශ පත්‍රයේ (පී5) කාමර 452 ක් නියම කර දක්වා තිබීම සහ 1984.01.07 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කරන ලද, 3 වැනි විත්තිකාර සමාගම විසින් පිළියෙල කරන ලද සැළසුම්පත්වල සහ 1 වැනි විත්තිකාර සමාගමේ ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනයන් (පී18ඒ) අනුවත් කාමර 452 ක් බව එකී උත්තරයේ 7, 8 සහ 9 දරණ ජේදවලින් පිළිගනි. |
| 5 | හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ ආදායම් සහ වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශය සහ 1983.03.31 දිනැති ලිපිය (පී7ඒ) සහ (පී7බී) හා ඒ අනුව 1980 ජුලි මස ගෘහ නිර්මාණ සැළසුම්වල (පී8) අනුකූලතාවය අනුව, එකී පූර්වානුමාන ප්‍රකාශය කාමර 456 ක් සඳහා වූ බව පිළිගනි. |

එකී උත්තරයේ 18 වැනි ජේදයේදී ඉහත සඳහන් කරන ලද කාමර 456 (එනම්, අමුත්තන්ගේ කාමර 452 කළමණාකරුගේ නිවාසස්ථාන කාමර 4) නිවැරදිව පිළිගනි.

අදාළ ගිවිසුම්/කොන්ත්‍රාත් ලිපි සහ විශේෂයෙන්ම චිත්‍ර සහ වැඩ නියමාවලී හා ගෘහ භාණ්ඩ සවිකරන උපකරණ සැපයීම් පිළිබඳ විෂය ප්‍රමාණයන් අදාළ ගිවිසුම්වල/කොන්ත්‍රාත්වල (පී9), (පී11), (පී12), (පී13), (පී14) අවශ්‍ය කොටස් බව පිළිගනි.

ණය ගිවිසුම (පී15) සහ ආපසු ගෙවීමේ වාරිකයක්, 1 වැනි විත්තිකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනය සමඟ අනුකූල වන බව පිළිගනි.

කෙසේ වෙතත්, එකී උත්තරයේ 5 වැනි ජේදයෙන් හිල්ටන් සමාගම විසින් ලාභ ඉපදවීම ගණන් බැලීමේ පදනම සහ පිළිවෙලින් පැමිණිලිපතේ 19(ඇ), 20 සහ 22(ඇ) ජේදයන් හි සම්ප්‍රකාශයන් පිළිගනිමින්, එහි 7, 8 සහ 9 දරණ ජේදයන් හි, කාමර සංඛ්‍යාව 452 ක් බවට පිළිගනි.

7 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් විසින් අත්තිකාරම් දෙන ලද ණය මුදල් ප්‍රධාන වශයෙන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් විසින් ඇත්තවශයෙන්ම කරන ලද වැඩ සඳහා 3 වැනි විත්තිකාර සමාගමෙන් ලබාගත් ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සහතික නොමැතිවම, ඔවුන්ටම ගෙවීමට ප්‍රයෝජනයට ගත් බව පිළිගනි.

ප්‍රකාශ පත්‍රය සහ එහි නම්කර ඇති ප්‍රවර්ධකයින් හා හෝටලයට වාහන 400 සඳහා ආවරණය වූ කාර් නැවතුම්පොළ සමඟ තට්ටු 22 දක්වා විහිදී යන කාමර 452 ක් සඳහා වූ බව පිළිගනි.

8 1984.01.07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී හෝටල් ව්‍යාපෘතිය සහ අදාළ ගිවිසුම්/කොන්ත්‍රාත් සහ 3 වැනි විත්තිකාර සමගමේ සහ ගෘහ නිර්මාණ සැළසුම්, 4 වනි විත්තිකාර සමාගම විසින් අනුමත කිරීමේ දී, හෝටලයට අමුත්තන්ගේ කාමර 452 ක් තිබියු යුතු බව පිළිගනි.

1 වැනි විත්තිකාර සමාගමේ ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනයන්, අමුත්තන්ගේ කාමර 452 පදනම් කරගෙන බව පිළිගනි. (පැමිණිලිපතෙහි 19(ඈ) ජේදය)

තරු පහේ පන්තියේ හිල්ටන් ජාත්‍යන්තර මට්ටමේ අමුත්තන්ගේ කාමර 452 කින්, යෝජිත හෝටලය සමන්විත විය යුතු වනසේ ගොනැගිය යුතුව තිබූ බව පිළිගනි. (පැමිණිලිපතේ 19(ඕ) ජේදය)

9. 1983 ඔක්තෝබර් මස ඉදිරිපත් කළ පත්‍ර 27 යුත් ගෘහ නිර්මාණ සැළසුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලැබීමට අනතුරුව 1984 මාර්තු මාසයේ දී හෝටලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ බව පිළිගනි.

1984.01.07 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී එකී සැළසුම්වල පිටපතක් සභාගත කරනු ලැබ ඇති බව හා අධ්‍යක්ෂ මණ්ඩලයට කාමර 452 තිබෙන බව සටහන් කරගෙන ඇති බව පිළීගනි. (පැමිණීලිපතෙහි 22(ඇ) ජේදය)

1984.01.07 දින පවත්වන ලද එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කළ 1 වැනි විත්තිකාර සමාගම විසින් පිළියෙළ කරන ලද ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශයත් හා මුදල් ගැලීමේ ප්‍රක්ෂේපනයන් කාමර 452 පදනම මත ගණන් බලා සාදා ඇති බව පිළීගනි. (පැමිණිලිපතේ 22(ඇ) ජේදය).

10. ඉදිකිරීම පිළිබඳ ප්‍රගතිය මත 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් වාර්තා නියම කර ඉල්ලා සිටින 1985.07.22 දිනැති පැමිණිලිකරගේ ලිපියට ද (පී21ඒ) සහ එය ස්ථිර කරමින් සටහන් කර ඇති 1985.07.25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව (පී21බී) පිළිගනි.

11. වෙනත් දේ අතර, සැළසුම් චිත්‍ර සහ ලියකියවිලි සියල්ල දැවී ඇති බවත් සඳහන් කළ වැඩ බිමේ 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල ගින්න පිළිබඳ වාර්තාව පිළිබඳව දැනුම් තේරුම් ඇතිව සිටින බව පිළිගනි.

12. 1987.06.08 දින අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ (පී23) විෂය අංක.10 යටතේ සටහන් කර ඇති පරිදි, එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කරනු ලැබ ඇති 1987 අප්‍රේල් මාසය සඳහා වන 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වල මාසික වාර්තාවෙන් (පී53බී) ඡායාරූපානුකූලව සාක්ෂි දරණ පරිදි, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත, එවකට සිටි විධායක අධ්‍යක්ෂ, එච්.ඔගාමි සමඟ එක්ව සිට පැහැදිලිවම හෝටල් ගොඩනැගිල්ල භාරගැනීමෙන් පසුව, 1987.04.30 දින එනම්, සති පහකට පෙර, හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයට භාර දෙනු ලැබ ඇති බව 5 වැනි විත්තිකරු වාර්තා කළ එකී 1987.06.08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව පිළිගනි.

13. හෝටලය විවෘත කිරීමට පසුව, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් විසින්, 1987.07.15, 1987.11.12 සහ 1987.11.18 දිනයන් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වූ ඔවුන්ගේ විශේෂ නියෝජිත එම්.කුබෝටා මාර්ගයෙන් ප්‍රතිශෝධිත ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන් (පී25බී) ඉදිරිපත් කරන ලද බව පිළිගනි. (අමුත්තන්ගේ කාමර 452 ක පදනම මත මෙම ප්‍රතිශෝධිත ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශයන් සහ මුදල් ලැබීමේ ප්‍රක්ෂේපනයන් ගණනය කර ඇත.)

14. ඊට ආසන්නතම වශයෙන්, පසුව 1987.12.30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද, පැමිණිලිකරු විසින් අධ්‍යක්ෂ මණ්ඩලය ඇමතූ ලිපිය (පී26ඩී) මඟින් වෙනත් දේ අතර, කාමර සංඛ්‍යාවේ විෂමතාවය, එනම් හිල්ටන් මාසික වාර්තාවේ සඳහන් කාමර 387 සහ කාමර 452 ක් වූ මුල් සංඛ්‍යාව පෙන්වා දී, තවද මෙම පදනම මත කාමරවල පදිංචිය 100% ක් වුවත් සහ අමුත්තන්ගේ කාමරයකට සාමාන්‍ය කාමර ගාස්තු ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 100 ක් වුවත්, මුළු ණය මුදල ගෙවීමට නොහැකි වන බවත් පෙන්වා දුන් බව ද පිළිගනි.

7 වැනි විත්තිකරු ඇතුළුව අනෙක් අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡා කිරීම සඳහා 1988.01.13 දින ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ, වෙනත් දේ අතර, කාමර ගණන පිළිබඳ විෂමතාව සහ මෙම ණය ගෙවීම පිළිබඳ නොහැකිකම ද දක්වමින් ලියන ලද පැමිණිලිකරුගේ ලිපියේ කෙටුම්පත (පී26ඊ) පිළිගනි.

7 වැනි විත්තිකරු එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට නොපැමිණි හෙයින්, එකී ලිපිය 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට යැවීමට පෙර, එය 7 වැනි විත්තිකරුට ඉදිරිපත් කරන ලෙසට 5 වැනි විත්තිකරුට නියම කර සිටි බව පිළිගනි.

එම කටයුත්ත ඉටු කළ බව පසුව පැවැති 1988.01.22 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 5 වැනි විත්තිකරු ස්ථිර කර සිටි බව පිළිගනි.

15. කාමර 387 ක් සඳහා වන, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත- එච්.ඔගාමි විසින් ඉදිරිපත් කරන ලද 1988.02.01 දිනැති ප්‍රතිශෝධිත ලාභ උපයන සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණය පිළිගනි.

කෙසේ වුවද, කාමර 452 මත ගණන් බලා සෑදූ, 1 වැනි විත්තිකාර සමාගමේ විශේෂ නියෝජිත එම්.කුබෝටා විසින් ඉදිරිපත් කරන ලද 1987.06.26 දිනැති ප්‍රතිශෝධිත ලාභ උපයන සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනයන් එකී උත්තරයේ 13 වැනි ජේදයේ පිළිගනි.

වෙනත් දේ අතර, 452 වන කාමර ගර්භ පිළිබඳ මුල් ගණනේ වෙනසක් නැති බව සහ ලාභ උපයන සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනය මත මෙය බලානොපාන බව ද ප්‍රකාශ කරමින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලින් ලැබුණු 1988.01.29 දිනැති ටෙලෙක්ස් පණිවුඩය පිළිබඳව දැනුම් තේරුම් ඇතිව සිටි බව පිළිගනි. මෙම ප්‍රකාශය ම නොමඟ යවන සුළු එකක් වෙයි.

16. කරුණු තිබෙන හැටියට, 3 වැනි විත්තිකාර සමාගම 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් සමඟ ස්ථිර වශයෙන් කිව නොහැකි සේ සම්බන්ධකමින් සිටි හෙයින්, අවසාන පරීක්ෂණයන් සඳහා ස්වාධීන ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබාගැනිමට 1988 මැයි මාසයේ දී (වරලත් ගණකාධිකාර ආයතනයේ සාමාජික වරලත් ගණකාධිකාරී සහ අර්නස්ට් ඇන්ඩ් යං ආයතනයේ ප්‍රධාන හවුල්කාර) එවකට සිටි රජයෙන් පත් කළ අධ්‍යක්ෂ ඇම්.ටී.ඇල්.ප්‍රනාන්දු යෝජනා කළ බව පිළිගනි. මෙය, 1988.08.25 දින 3 වැනි විත්තිකාර සමාගම අවසාන සහතිකය නිකුත් කිරිමට පෙර හා පැමිණිලිකරු කාමර ගණන සම්බන්ධ විෂමතාව නැගුවාට පසු, ඒ ආසන්නයේ දීම විය.

එකී යෝජනාවට 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිත එච්.ඔගාම් පළ කළ විරෝධතාව පිළිගනී.

17. 1988.08.25 වැනි දින 3 වැනි විත්තිකාර සමාගම විසින් අවසාන සහතිකය නිකුත් කිරීමට පෙර ස්වාධීන ඉංජිනේරුවරයෙකු විසින් හෝටලය පරීක්ෂා කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කළ බව පිළිගනී.

7 වැනි විත්තිකරුගේ 1988.08.08 දිනැති ලිපියේ අන්තර්ගත කරුණු මත හා 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිත එච්.ඔගාම්ගේ විරෝධතාවය මත අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි ස්වාධීන ඉංජිනේරුවකු පත් නොකිරීමට තීරණය කළ බව පිළිගනී.

18. එකී උත්තරයේ 5 වැනි ඡේදයේ වරුදි උත්තරයට පටහැනි වෙමින් හා එය නිවැරදි කරමින් හිල්ටන් ආයතනයේ ආදායම් සහ වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශය (පී7ඒ) සහ (පී7බී) කාමර 456 සඳහා වූ බව පිළිගනී.

19. ස්වාධීන වරලත් ගෘහ නිර්මාණ ශිල්පී ෂෙල්ටන් විජේරත්නගේ වාර්තාව (පී32ඒ) දැන සිටි බව පිළිගනී.

20. 3 වැනි විත්තිකාර සමාගමේ 1987.04.30 දිනැති වැඩ අවසන් සහතික සහ 1988.08.25 දිනැති අවසන් සහතිකය (පී31ඒ) සහ (පී31බී) පිළිගනී. ඒවායේ පිටපත් ඉදිරිපත් කළේ ඔහුගේ ඉල්ලීම මත පමණක් බව සහ අදාළ කාලයේ දී අඩුපාඩුකම සම්බන්ධව කටයුතු කිරීමට පමාවීම පිළිබඳව උත්තරයේ නිදහසට කරුණු ඉදිරිපත් කර නැති බව පැමිණිලිකරු නැවත නැවතත් ප්‍රකාශ කරයි.

21. 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම විසින් 1990.03.11 දිනට මුදල් ගෙවීම් කල් තැබීම සහ එය නැවත සත්‍ය ලේඛණගත කිරීමක් නොවන බව පිළිගනී.

22. ණය නැවත ලේඛණගත කිරීමේ ගිවිසුම්වල උකස පිළිබඳ වගන්තිය අන්තර්ගත කිරීමට පැමිණිලිකරු සහ රජයෙන් එවකට පත්කළ අධ්‍යක්ෂ ආචාර්ය ඒ.සී.රන්දෙනි විරුද්ධ වූ බව පිළිගනී. උකස පිළිබඳ වගන්තිය අන්තර්ගත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය

සමස්ථයක් වශයෙන් විරුද්ධ වූ බව 4 වැනි විත්තිකාර සමාගම සඳහන් කරයි.

1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට රාජ්‍ය ඇපවීමේ ලිපියක් සහ උකස්කරය යන දෙකම ලබාගැනීමට නොහැකි බව පැමිණිලිකරු සහ එකී ආචාර්ය ඒ.සී.රන්දෙනිය තරයේ කියා සිටි බව <u>පිළිගනී.</u>

එකී උකස් කිරීම පිළිබඳව වගන්තිය වහාම කපා හැරීමට නියම කරමින් ඉල්ලා සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් ලැබුණු 1989.11.20 දිනැති ලිපිය (පී34සී) <u>පිළිගනී.</u>

25. මුදල් ලබාගැනීම සඳහා වූ එච්.ඔගාමිගේ ක්‍රියා පිළිවෙල <u>පිළිගනී.</u> මෙය ගෘහ භාණ්ඩ සවිකරණ උපකරණ සහ උපකරණ ගාස්තු සඳහා අර්ධ පියවීමක් වෙනුවෙන් බව සඳහන් කරයි.

1 වැනි විත්තිකාර සමාගම විසින් සපයන ලද, ගෘහ භාණ්ඩ, සවිකරණ උපකරණ සහ උපකරණවල ගිණුමක් හෝ සසඳා බැලූ දේපල ලැයිස්තුවක් හෝ නොවූ බව එකී උත්තරයේ 54 වැනි ජේදයෙහි දි <u>පිළිගනී.</u>

1 වැනි විත්තිකාර සමාගම විසින් සැපයිය යුතු සැපයීම්වල විෂය ප්‍රමාණය නිශ්චිත වශයෙන් දක්වන සැපයීම් කොන්ත්‍රාත්තුව සඳහා 'ඒ' අක්ෂරය ලකුණු කරන ලද ප්‍රදර්ශකය නොමැති බව එකී උත්තරයේ 54 වැනි ජේදයෙහි ද <u>පිළිගනී.</u>

28. වෙනත් දේ අතර, දී ඇති කරුණු තිබෙන හැටියට,

(අ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට යම් වාරික ගෙවීමක්වත් කිරීමට පෙර පොදු කොටස් හිමිකරුවන්ට ඔවුන්ගේ කොටස් මූල ධනය ආපසු දිය යුතු බවත්,

(ආ) 3 වැනි විත්තිකාර සමාගමෙන් ඒකාන්ත නියමයෙන් සතුටුදායක <u>පැහැදිලි කිරීම්</u> ලැබෙනතාක් කල්, 4 වැනි විත්තිකාර සමාගම 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට යම් ගෙවීමක්වත් කරනවාට ඔහු එකඟ නැති බවත්,

ප්‍රකාශ කළ 1989.11.27 සහ 1989.12.13 දිනැති පැමිණිලිකරුගේ සංදේශ <u>පිළිගනි.</u>

29. }
30. } 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වල නියෝජිතයින් සමග 7 වැනි සහ 5 වැනි විත්තිකරුවන් සහභාගී වූ 1990.01.26 වැනි දින මුදල් අමාත්‍යාංශයේ පැවැත්වූ රැස්වීම ගැන දන්නා බවත් <u>පිළිගනි.</u>

එකී රැස්වීමේදී 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.0 මත ගෙවීම් කිරීමට යෝජනාවක් කරනු ලබ ඇති බව <u>පිළිගනි.</u>

ඒ බව 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට දැන්වූයේ 1990.08.02 වැනි දින, එනම් එකී රැස්වීමෙන් පසුව පමණක් බව දන්නා බැව් <u>පිළිගනි.</u>

31. 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.0 වන එකී ගෙවීම කළ බව පිළිගනි.

32. එකී ගෙවීම සාකච්ඡා පදනම් කරගෙන කළ බව <u>පිළිගනි.</u>

33. }
34. } පැමිණිලිකරුගේ 1989.12.13 දිනැති සංදේශයේ අඩංගු කරුණු <u>පිළිගනි.</u>

7 වැනි විත්තිකරුගේ 1990.02.08 දිනැති ලිපියෙහි අඩංගු කරුණු 4 වැනි විත්තිකාර සමාගම <u>පිළිගනි.</u>

පැමිණිලිකරුගේ 1989.12.13 දිනැති සංදේශයෙහි වෙනත් දේ අතර පහත සඳහන් කරුණු ද ඇතුළත් බව <u>පිළිගනි.</u>

> ''විශේෂයෙන් ම නියම කර ඇති සංඛ්‍යාවන්ට/ප්‍රමාණයන්ට අදාළ වන පරිදි, මා විසින් ඉහත දක්වා ඇති නියමයන්ට අනුකූලව හෝටල් ඉදිකිරීම් කරගෙන යනු ලබන්නේ දැයි අමුණා ඇති වැඩ අවසන් සහතික පත්‍රයේ පිටපතින් මට සෑහීමට පත්විය නොහැක.''

7 වැනි විත්තිකරුගේ 1990.02.28 දිනැති ලිපියෙහි වෙනත් දේ අතර පහත සඳහන් කරුණු ද ඇතුළත් බව <u>පිළිගනි.</u>

''සහතික දෙක හෝටලයේ ඉදිකිරීම් වැඩ කටයුතු කොන්ත්‍රාත්තුවේ සියලු නියමයන්ට අනුකූල වන බවට සෑහෙන ආවරණ වේ.''

ඉහත සඳහන් පරිදි කරුණු සඳහන් කර ඇත්තේ විශේෂයෙන් නියම කළ පරිමාණ පත්‍ර සහ අවසාන වැඩ මැනීම්, මුල් සැළසුම්, ගෘහ භාණ්ඩ, සවිකරණ භාණ්ඩ සහ උපකරණ පිළිබඳ නිසි පරිදි ගිණුම් ගතකර සසඳා බැලූ දේපල ලැයිස්තුව සහ 'ඒ' අක්ෂරය ලකුණු කළ ප්‍රදර්ශිතය නොමැතිව තිබියදී බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

පැමිණිලිකරුගේ 1989.12.13 දින දරණ සංදේශයේ වෙනත් දේ අතර පහත සඳහන් කරුණු ද,

එනම්,
''සම්ප්‍රදායික භාවිතයට අනුකූලව සියලුම පරිමාණයන් සහ වැඩ මැනීම් සහිතව සවිස්තරාකාරයෙන් යුත්වැඩ අවසාන සහතික පත්‍රයක් සාමාන්‍යයෙන් කෙනෙකුට බලාපොරොත්තු වන්නට ඉඩ තිබුණි. මේ සම්බන්ධයෙන් නිර්මාණ ශිල්පීන්ගෙන් සතුටුදායක පැහැදිලි කිරීම් සහ ස්ථිර කිරීම් ලබාගැනීමට මම කැමැත්තෙමි. ඒකාන්ත නියමයන් මත එවැනි සතුටුදායක පැහැදිලි කිරීම් සහ ස්ථිර කිරීම් මට ලැබෙන තුරු ගෙවිය යුතු ඉතිරි ඉදිකිරීම් සහ/හෝ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් ඉදිකිරීම් සංවිධානයට කිසිදු ගෙවීමක් කිරීමට එකඟවීමට මට නොහැකිවීම ගැන කණගාටු වෙමි.'' යනුවෙන් තවදුරටත් ඇතුළත් කර ඇති බව <u>පිළිගනී.</u>

1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට මුදල් ගෙවීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් බලවත් විරුද්ධත්වය දැක්වීමට පෙළඹුනේ 4 වැනි විත්තිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ යහපත සහ ප්‍රස්තුත රාජ්‍ය ඇප ලිපිය සම්බන්ධයෙන් විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහජනතාවගේ යහපත සලකා බව නිර්මලව පැහැදිලිය.

36. පහත සඳහන් කරුණු,
නියම සහතික සහ ලියකියවිලි 3 වැනි විත්තිකාර සමාගමෙන් ලැබී නැති බව, විශේෂයන් නියම කළ පරිමාණ පත්‍ර සහ අවසාන වැඩ මැනීම් නැතිව එකී සහතික නොසෑහෙන බව,
කාමර ගණනේ විෂමතාව ගැන,
පැමිණිලිකරු 1989 නොවැම්බර්/දෙසැම්බර් මාසවලදී 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සැළකර සිටි බව <u>පිළිගනී.</u>

37. සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් සොයා ගැනිම පිළිගනි.

පැමිණිලිකරු විසින් 1990.03.07 වැනි දින 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එම සංශෝධිත සැළසුම් සොයා ගැනිම දැනුම් දුන් බව දැනුම් තේරුම් ඇතිව සිටි බව <u>පිළිගනි.</u>

39. කාමර ගණනකට සම්බන්ධ ප්‍රශ්නය පැමිණිලිකරු නැවත වරක් ඉදිරිපත් කළ බව <u>පිළිගනි.</u>

41. එම එකී උත්තරයේම 37 වැනි ඡේදයේ දැනුම් තේරුම් නොමැති බව ප්‍රකාශ කළ සිය අසත්‍ය සැළකිරිමට පරස්පර විරෝධීව එකී සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් සොයා ගත්තේ කුමන තත්ත්වයක් යටතේ ද යන්න දැනුම් තේරුම් ඇතිව සිටි බව දැන් <u>පිළිගනි.</u>

43. 1990 මාර්තු මාසයේ දී සොයාගන්නා ලද සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් 3 වැනි විත්තිකාර සමාගම විසින් පිළියෙළ කරන ලද බව <u>පිළිගනි.</u>

තවද, එම කරුණු දිගමට සඟවා සිටි 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් විසින් ද දැන් පිළිගෙන ඉඩ දී ඇත.

45. 1984 මාර්තු මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරියේ දී අනුමත කරනු ලැබ ඇති මුල් ගෘහ නිර්මාණ සැළසුම් නාගරික සංවර්ධන අධිකාරියේ නොමැති බව <u>පිළිගනි.</u>

46. එකී උත්තරයේ 24 වැනි ඡේදයේ ඒ සමාන ලිපි ගනුදෙනු පිළිබඳ දැනුම් තේරුම් නොමැති බවට ප්‍රකාශ කරමින් කළ සිය සැළකිරිමට පරස්පර විරෝධීව පැමිණිලිකරු එච්.ඔගාම් සමඟ කළ ලිපි ගනුදෙනුව පිළිබඳව දැනුම් තේරුම් ඇති බව <u>පිළිගනි.</u>

3 වැනි විත්තිකාර සමාගමේ සහතික සහ නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අනුකූලතා සහතිකය 4 වැනි විත්තිකාර සමාගමේ අනුමැතිය නැතිව ඉදිරිපත් කළ සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයකට සම්බන්ධතාවය ඇති බව දැනුම් තේරුම් ඇති බව <u>පිළිගනි.</u>

1984 මාර්තු මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක් මත පදනම් වී, 1984 මාර්තු මාසයේ දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ බව සහ එම සැළසුම් චිත්‍ර සහ වැඩ නියමාවලියන් ඉදිකිරීම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සකස් වූ බව දැනුම් තේරුම් ඇති බව පිළිගනි.

48. 1990.03.07 වැනි දින පැමිණිලිකරු විසින් එකී බරපතල කරුණ 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලද බව පිළිගනි.

පැමිණිලිකරු විසින් බලකර ඉල්ලා සිටිම නිසා මේ සම්බන්ධයෙන් 3 වැනි විත්තිකාර සමාගමට කෙළින්ම ලිපි ලිවීමට පැමිණිලිකරුට, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද බව පිළිගනි.

මෙය ඉතා බරපතල කරුණක් බවට රජයෙන් පත් කළ අධ්‍යක්ෂ කේ.ෂන්මුගලිංගම් විසින් ප්‍රකාශ කර ඇති බව පිළිගනි.

එකී එම උත්තරයේම 17 වැනි ඡේදයේ සැළකර සිටින, නොදැන සිටිමට පරස්පර විරෝධිව යමින් මෙරට ගෘහ නිර්මාණ ශිල්පියෙකු, ඉංජිනේරුවරයෙකු පැමිණිලිකරුට සහායවීම අනුමත කිරිම පිළිගනි.

3 වැනි විත්තිකාර සමාගමෙන් මුල් ගෘහ නිර්මාණ සැළසුම් සහ වැඩ පරිමාණ පත්‍රවල පිටපතක් ලබාගැනිමට පැමිණිලිකරු තීරණය පිළිගනි.

51. එකී ආයෝජන ගිවිසුමේ 6.01 (iv) (ඊ) වගන්තිය සහ 12.02 වගන්තිය පරිදි මුල් කොන්ත්‍රාත් ගිවිසුම්වලට යම් සංශෝධන කරන්නේ නම්, ඒවා ශ්‍රී ලංකා රජය ඇතුළුව එකී ආයෝජන ගිවිසුමේ (පී9) සියලු පර්ශවයන් විසින් ලිඛිතව ඇතුළත් වියයුතු බවට සහ තවද, මොන මොන යම් අරමුණක් සඳහාවත්, එකී ආකාරයෙන් ම සියලු පාර්ශවයන් විසින් ලිඛිතව ස්ථිර කරනු නොලැබුවහොත්, සංශෝධනය හෝ විකරණය ඵලදායි නොවිය යුතු බව පිළිගනි.

එමනිසා ඉදිකිරීම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සකස් වූ මුල් ගෘහ නිර්මාණ සැළසුම් සංශෝධනය කිරීම වැනි ලිඛිත ගිවිසුමක් නොමැති විටදී, ඵලදායි නැති සහ අනුමත නොකළ එකක් බව වක්‍රව පිළිගනී. 4 වැනි විත්තිකාර සමාගමට එවැනි ලිඛිත ගිවිසුමක් ඉදිරිපත් කර නැත.

පැමිණිලිපතේ 48(ඇ) ඡේදයට විශේෂිත වශයෙන් උත්තරදීම 4 වැනි විත්තිකාර සමාගම හිතාමතාම මගහැර ඇති අතර, මුල් ගෘහ නිර්මාණ සැළසුම් නොතිබීම 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගනු ලැබ ඇති, පැමිණිලිපතේ 48(අ) සහ (ආ) උපඡේදවල ඇති සම්ප්‍රකාශයන් අනුව ඒවාට යම් සංශෝධනයක්වත් කිරීමට ලිඛිතව ගිවිස ගැනීම අවශ්‍ය වන්නේ ය යන කරුණට මොන මොන යම් ආකාරයකින්වත් කිසිසේත් සම්බන්ධ නොවේ.

මුල් ගෘහ නිර්මාණ සැළසුම් නොමැති බව විශේෂිතව <u>පිළිගනී.</u> 3 වැනි විත්තිකාර සමාගම විසින් මෙම නඩුවේ නඩු පොතේ ගොනුකර ඇති '3ආර්1' ලියවිල්ල මුල් ගෘහ නිර්මාණ සැළසුමේ පිටපතක් නොවන බව ඒ මගින් පිළිගනියි. කෙසේ වෙතත්, සිය සමාගම සන්තකයේ තිබිය යුතුව ඇති, මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල අයිතිකරුගේ පිටපතට කුමක් සිදුවී ද යන්න පැහැදිලි කිරීමට 4 වැනි විත්තිකාර සමාගම අපොහොසත් වී ඇත.

53. මුල්ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් ලබාගැනීම සඳහා වූ පැමිණිලිකරුගේ ප්‍රයත්නයන් <u>පිළිගනී.</u>

ඒවා 4 වැනි විත්තිකාර සමාගමේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ සන්තකයෙහි නොතිබීම <u>පිළිගනී.</u>

එකී උත්තරයේ 48 ඡේදයෙන් පිළිගන්නා අතර, එසේ හෙයින්, අංක.50(v) සහ අංක.50(vi) යන උප ඡේදවල දැනුම් තේරුම් නොමැති බව ප්‍රකාශ කිරීම නොපිළිගත හැකිය. අදාළ ලිපි ගනුදෙනු කිරීම් ද අධ්‍යක්ෂවරුන් වෙත බෙදාහරින ලදී.

උපඡේද 50(11) සහ (111) සඳහා සම්ප්‍රකාශ, 4 වැනි විත්තිකාර සමාගමේ ම සාමාන්‍යාධිකාරි විසින් පැමිණිලිකරුගේ අවධානයට යොමු කරන ලද කරුණු වේ.

54.
55.

1 වැනි විත්තිකාර සමාගම විසින් සපයන ලද ගෘහ භාණ්ඩ, සවිකරන උපකරණ සහ උපකරණ පිළිබඳව යථා පරිදි ගිණුම්ගත කර සසඳන ලද දේපල ලැයිස්තුවක් නොමැතිව බව පිළිගනි.

1 වැනි විත්තිකාර සමාගම විසින් සැපයිය යුතු ගෘහ භාණ්ඩ, සවිකරන උපකරණ සහ උපකරණ සැපයීමේ ප්‍රමාණය සැපයීමේ කොන්ත්‍රාත්තුවේම (පී13) අවශ්‍ය කොටසක් ලෙස සකස් වී ඇති 'ඒ' අක්ෂරයෙන් ලකුණු කර ඇති ප්‍රදර්ශිතයේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බව පිළිගනි.

1 වැනි විත්තිකාර සමාගම විසින් සැපයිය යුතු ගෘහ භාණ්ඩ, සවිකරන උපකරණ සහ උපකරණ සැපයීමේ ප්‍රමාණය 'ඒ' අක්ෂරයෙන් ලකුණු කර ඇති එකී ප්‍රදර්ශිතයේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බවත්, එමෙන්ම, සැපයීමේ කොන්ත්‍රාත්තුවේ (පී13) අවශ්‍ය කොටසක් ලෙස සකස් වන 'ඒ' අක්ෂරයෙන් ලකුණු කර ඇති ප්‍රදර්ශිතය 4 වැනි විත්තිකාර සමාගම වෙත නොමැති වූ බවත් පිළිගනි.

එමනිසා, 1 වැනි විත්තිකාර සමාගම විසින් ඉටු කළයුතු ගෘහ භාණ්ඩ, සවිකරණ උපකරණ සහ උපකරණ සැපයීම්වල ප්‍රමාණාත්මක වශයෙන් ගුණාත්මක වශයෙන් සහ නියමාවලී වශයෙන් හරි වැරැදි බැලීමට 4 වැනි විත්තිකරුට නොහැකි බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

පැමිණිලිපතෙහි උපජේද 51(අ), 51(ආ) සහ 51(ඇ) හි 4 වැනි විත්තිකාර සමාගම විසින් කර ඇති ඉහත සඳහන් පිළිගැනීම් වලින් ඉටු කරනුයේ, පැමිණිලිපත්‍රයේ උපජේද 51(ඇ) සහ 51(ඉ) හි පැමිණිලිකරුගේ සම්ප්‍රකාශ තහවුරු කිරීම පමණකි.

56. මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් ඉදිරිපත් කිරීම 3 වැනි විත්තිකාර සමාගම විසින් මගහරිනු ලැබූ විටදී, මුදල් අමාත්‍යාංශයට යවන ලද අනෙකුත් ලිපි ගනුදෙනු කිරීම් ගැන සඳහන් කරමින්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්.පාස්කරලිංගම් මහතා වෙත යවන ලද පැමිණිලිකරුගේ 1990.06.29 දිනැති ලිපිය පිළිගනි.

පැමිණිලිකරුගේ ලිපියේ වෙනත් දේ අතර, පහත සඳහන් කරුණ ද ඇතුළත් විය.

''ප්‍රථම අවස්ථාවේදී ම අදාළ පැහැදිලි කිරීම් සහ සම්බන්ධිත සහතික කිරීම් සතුටුදායක ලෙස බේරුම් කර ගන්නා තුරු විදේශීය පාර්ශවකරු සමඟ යම් කතාබහක්වත් අවසන් නොකළ යුතු බව මම සිතමි.''

59.
60. අනවසරයෙන් සංශෝධනය කළ ගෘහ නිර්මාණ සැළසුම් පිළිබඳව සොයාගැනිම පිළිබඳව 1990.03.07 දින අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළිකිරීමෙන් සහ 1990.04.24 දිනැති පැමිණිලිකරුගේ සංදේශයට පසුව, බරපතල කඩකිරීම් සහ ඒ පිළිබඳව ඇති සම්බන්ධකම් දක්වමින්, පහත දක්වා ඇති දිනවල දී පැමිණිලිකරු විසින් ඉදිරියේ ඉදිරිපත් කරන ලද පහත සඳහන් එනම්,

1990.05.31 දිනැති ලිපිය
1990.06.29 දිනැති ලිපිය
1990.07.04 දිනැති සංදේශය
1990.08.29 දිනැති සංදේශය

සහ ලිපි සහ සංදේශ පිළිගනි.

එකී සංදේශ සහ ලිපි යවා තිබියදීත්, 4 වැනි විත්තිකාර සමාගම කිසිදු ක්‍රියා මාර්ගයක් ගැනිම පැහැරහැර, එසේ කිරීමට ද අසමත් වී ඇති අතර, පැමිණිලිකරු මීට කලින් විමසීම් මතුකළ විටදී ද කිසිදු පියවරක් නොගත් අතර, දැන් පිළිගනු ලබන එකී කරුණු කීපය පිළිබඳව කිසිදු පරීක්ෂණයක් පවත්වා නැත. 4 වැනි විත්තිකාර සමාගම, සිය සමාගමේ සැළකිය යුතු අක්‍රීයභාවය පැහැදිලි කිරීමට ද අසමත් වී ඇත.

62. අවසාන සහතිකය නිකුත් කිරීමෙන් පසුව වගකීම් කාලසීමාව අවුරුදු 5 ක් බව පිළිගනි. ඒ අනුව 4 වැනි විත්තිකාර සමාගම විසින් පිළිගන්නා ලද පරිදි, අවසාන සහතිකය නිකුත් කර ඇත්තේ, 1988.08.25 වැනි දින වන හෙයින්, එකී පස් අවුරුදු වගකීම් කාලසීමාව 1993.08.24 වැනි දින දක්වා පැවැත්වේ.

එවැනි වගකීම් කාලසීමාව තුල මෙම නඩුව පවරා ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.